# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 12,219— 1960 ඔක්තෝබර් 28 වැනි සිකුරාද — 28.10.1960

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (II) වැනි ඡේදය—පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි, සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු, ඇබෑර්තු ... ... | 787 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | 806 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | 791 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 793 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | 804 | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | — | විවිධ දැන්වීම් ... ... ... | — |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාර යෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට $7\frac{1}{2}$කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥා පනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණ යකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන් කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන් හිදී මිස අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නව ප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූලව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් ස්වකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතා සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇත" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත් එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—"නව ප්‍රවේශක නිලධාරීහු" යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසුව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද එසේ ම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛනයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූලව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින් ම, ඉදිරිපත් කළ යුතු ය. "ලාංකික" යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියෙකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නාවූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනෙකුට මද ඔවුනු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර් 31 වැනි දිනත් යන මෙදැතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ ස්වකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ ස්ථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාර්තමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම්කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද නැද්දැයි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපේක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපේක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපේක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### ගොඩනැගිලි හා සිවිල් ඉංජිනේරු ශිල්පී—සහකාර ෆෝර්මන් තනතුරක්

1. රාජකීය ලංකා ගුවන් හමුදාවේ ගොඩනැගිලි හා සිවිල් ඉංජිනේරු ශිල්පී සහකාර ෆෝර්මන් තනතුරක් සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. වැටුප්.—තනතුරට අදාල වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 1,860—120—3,780ක් වේ.

3. බඳවා ගැනීමේ කොන්දේසි—

(1) තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් රහිත වේ. තෝරාගනු ලැබූ අපේක්ෂකයා පත් කරනු ලබන්නේ වර්ෂ 3ක ආධුනික පරීක්ෂා කාලයක් යටතේ ය.

(2) තෝරාගනු ලැබූ අපේක්ෂකයා කෙටිකාල නිවේදනයකින් තම රාජකාරිය භාරගත යුතුවත් හැර, දිවයිනේ කවර ප්‍රදේශයක හෝ සේවය කිරීමට සූදානම් වී සිටිය යුතුයි. දැනට කොළඹ, චයිනාබේ, කටුනායක හා දියතලාව යන තන්හි රාජකීය ලංකා ගුවන් හමුදාවේ මධ්‍යස්ථාන පිහිටා තිබේ.

4. අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද—

1. සෑම ඉල්ලුම් කරුවෙක් ම පහත සඳහන් කරුණු පිළිබඳ සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි :—

(අ) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට උසස් විභාගයකින් හෝ සමත් වී සිටීම ;

(ආ) පිළිගත් ඉංජිනේරු සමාගමක හෝ ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක යටත් පිරිසෙයින් වර්ෂ 5ක ආධුනික කාලයක් සතුටුදායක ලෙස සම්පූර්ණ කර තිබීම හා එම කාලය තුළ යටත් පිරිසෙයින් වර්ෂ 2ක් වත් පරිපාලක තත්ත්වයක සේවය කර තිබීම ;

(ඉ) යටත් පිරිසෙයින් වර්ෂ 3ක ගොඩනැගිලි හා සිවිල් ඉංජිනේරු ගොඩනැගීම් වැඩ වල පළපුරුද්දක් ද ගොඩනැගිලි හා සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් නඩත්තු කිරීමේ පළපුරුද්ද ද තොග ඇස්තමේන්තු කිරීමේ සහ සෘජු කම්කරු පාලනයේ පළපුරුද්දක් ද තිබිය යුතුය. මේ කාලය ඇතුළත යටත් පිරිසෙයින් එක වර්ෂයක්වත් පරිපාලක තත්ත්වයක සේවය කර තිබිය යුතුයි.

5. වෙනත් අවශ්‍ය සුදුසුකම්—

සෑම ඉල්ලුම්කරුවෙක් ම පහත සඳහන් කරුණු පිළිබඳ සෑහෙන සාක්ෂ්‍ය ඉදිරිපත් කළ යුතුයි :—

(අ) 1960 නොවැම්බර් 1 වෙනි දිනට වයස අවුරුදු 25කට අඩු නොවීම සහ අවුරුදු 40 ඉක්මවා නොතිබීම ;

(ආ) සදාචාර චරිතයකින් යුතුවීම හා ශාරීරිකව සුදුසු වීම.

6. 1956 ජූලි 6 වැනි දිනදී හෝ ඊට පසුව ලංකාවේ එක්සත් රාජධානි කඳවුරු වලින් අස් කරනු ලැබූ සිවිල් සේවකයින්ට හා ලංකාවේ එක්සත් රාජධානි කඳවුරු ආණ්ඩුව යටතට ගැනීමේ තීරණය නිසා ඉහත සඳහන් දිනෙන් පසුව සේවයෙන් අස් කරනු ලබන සේවකයින්ටද, පහත සඳහන් අනුග්‍රහයන් දෙනු ලැබේ :—

(i) එක්සත් රාජධානි කඳවුරුවල කළ සේවා කාලයට සමාන කාලයක් වයස පිළිබඳ සුදුසුකම් ලබාගැනීම සඳහා පමණක් වයසින් අඩුකර ගැනීමට ඉඩ දෙනු ලැබේ ;

(ii) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය අධ්‍යාපන සුදුසුකම් වශයෙන් වුවමනා සෑම අවස්ථාවේදීම 7 වැනි ප්‍රමාණයෙන් සුදුසුකම පිළිගනු ලැබේ ;

(iii) ආධුනික කාලසීමාව හා පළපුරුද්ද වුවමනා නැත. එනමුත් නියමිත පළපුරුදු කාලයට ආධුනික කාලයද එකතු කර ගණන් ගනු ලැබේ.

7. ඉල්ලුම් කරුවන් තම ඉල්ලුම්පත්වලට පහත සඳහන් ලේඛන පිටපත් අමුනා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය (බෞතිස්ම සහතිකද හා ආධාර ලබන පාසැල් රෙගුලාසි අනුව නිකුත් කරන ලද සහතිකද භාරගනු නොලැබේ.) ;

(ආ) ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතිකය ;

(ඉ) ඉහත පළපුරුද්ද පිළිබඳ සහතිකය ;

(ඊ) චරිතය පිළිබඳ මෑතදී ලබාගත් සහතික දෙකක් (දැනට ආණ්ඩුවේ සේවයේ නියුක්ත ආධුනිකයන් චරිත සහතික නොඑවිය යුතුයි.)

8. ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ මුළින් ම සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ.

9. ඉහත අභ්‍යාසය, පළපුරද්ද හා රැකීරක්ෂා පිළිබඳ කරුණු ඇතුළත් ඉල්ලුම් පත්‍ර ලියුම් මාර්ගයෙන් ගුවන් හමුදාවේ අණ දෙන නිලධාරි තැන, තැපැල් පෙට්ටිය 594, කොළඹ, කියා එවිය යුතුයි. ඉල්ලුම් පත් බහා එවන ලියුම් කවරයේ ඉහල වම් කෙළවරේ "ගොඩනැගිලි හා සිවිල් ඉංජිනේරු ශිල්ප සහකාර ෆෝර්මන් තනතුර සඳහා ඉල්ලුම් කිරීම" යයි සඳහන් කර 1960 නොවැම්බර් 18 වැනි දිනට හෝ ඊට ප්‍රථමයෙන් ගුවන් හමුද අණ දෙන නිලධාරි තැනට ලැබෙන පරිදි එවිය යුතුයි.

ඇම්. දේවදාසන්,
සිවිල් පාලක හා ගණකාධිකාරී,
රාජකීය ලංකා ගුවන් හමුද මූලස්ථානය.

10-822.

---

## ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

### ෆිටර්වරු තිදෙනෙකු සඳහා ස්ථිර පත්වීම්

රජයේ මුද්‍රණාලයේ ෆිටර්වරු තිදෙනෙකුගේ තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ. පහත දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් විය යුතු ඉල්ලුම් පත්‍ර 1960 නොවැම්බර් 12 වැනි දින හෝ

ඊට ප්‍රථම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතුය. නියමිත ආකෘති පත්‍රයේ සකස් වී නැති ඉල්ලුම් පත්‍ර භාරගනු නො ලැබේ.

2. සියළුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයෙන් පසු දින 7ක් ඇතුළත ඉල්ලුම් පත්‍රය ලැබුණු බව හැඟවීමේ දැනුම් දීමක් නොලැබුණහොත් වහාම ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති වෙත ඒ බැව් දැන්විය යුතුය. මෙකී ප්‍රකාර ක්‍රියා නොකළහොත් සළකා බැලීම සඳහා තිබෙන අයිතිවාසිකම්වලට ඉල්ලුම්කරු අහිමි වනු ඇත.

3. තෝරා ගැනීමට ප්‍රථම නියමිත සුදුසුකම් ඇති අයදුම් කරුවන් සම්මුඛ පරීක්ෂණයකට සහ ප්‍රායොගික පරීක්ෂණයකට භාජන කරනු ලැබේ.

4. **සේවයට බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි.**—ආණ්ඩුවේ සේවයට කෙරෙන පත් කිරීම් පිළිබඳව ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රථම භාගයේ දෙවැනි කොටසේ සඳහන් වන සාමාන්‍ය නීති රීති ඉල්ලුම් කරුවන්ගේ සැලකිල්ලට යොමු විය යුතුය.

5. අයදුම්කරුවන් විසින් යටත් පිරිසෙයින් අවුරුදු දහයකවත් ෆිටර් කෙනෙකු වශයෙන් වැඩ කොට පළපුරුද්ද තිබිය යුතුය. ඔවුන්ට යන්ත්‍ර නඩත්තු කිරීමේ සහ අළුත් වැඩියා කිරීමේ පළපුරුද්දද තිබිය යුතුය.

6. **වැටුප්.**—ස්ථිර තනතුර සඳහා අදාළ වැටුප් ක්‍රමය නම් රුපියල් 1,086—42—1,548 කි. ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව සහ තාවකාලික විශෙෂ දීමනාව යන මෙම දීමනා ආණ්ඩුවේ රෙගුලාසීන්ට අනුව ගෙවනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් තුන් අවුරුදු සෝදිසි කාලයක් යටතේ පත් කරගනු ලැබේ.

7. තෝරා ගනු ලබන අයදුම්කරුවන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්‍ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්‍ෂණයකට පෙනීසිටීමට සහ දිවා කාලයේ හෝ රාත්‍රී කාලයේ වැඩ කිරීමට නියම කරනු ලැබේ.

8. ආදර්ශ ආකෘති පත්‍රයේ 8 (ඇ) දරණ ඡේලියෙන් අවශ්‍යයැයි පෙන්වා ඇති ළඟදී ලබා ගන්නා ලද සහතික පිටපත් (ඒවා ආපසු එවනු නොලැබේ.) තුනක් අයදුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුය. යටත් පිරිසෙයින් ඉන් දෙකක්වත් අයදුම්කරුගේ චරිතය සහ ඍජු භාවය පිළිබඳ සහතික විය යුතුය. ඉල්ලුම් පත්‍රය පහත දක්වා ඇති ආදර්ශ ආකෘති පත්‍රයේ ප්‍රකාර සකස් කර ගත යුතුය. මුද්‍රිත ආකෘති පත්‍ර නොමැත. ඉල්ලුම් පත්‍ර ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති නමට එවිය යුතුය. පෞද්ගලිකව මෙම දෙපාර්තමේන්තුවේ වෙන කවර නිලධාරියකුගේ හෝ නමට නො එවිය යුතුය.

9. කිසියම් අයදුම්කරුවකු වෙනුවෙන් ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති හෝ දෙපාර්තමේන්තුවේ වෙන යම් නිලධාරියකු සම්මුඛ ව සාකච්ඡා කිරීමට උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම එම අයදුම් කරු නුසුදුසු බවට පත් වන්නේ ය.

10. යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනි නම් රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

11. මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර හෝ ලෙසකින් වුවත් නොගැලපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්‍ෂෙප කරනු ලැබේ.

බර්නාඩ් ද සිල්වා,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1960 ඔක්තෝබර් 21 දින,
කොළඹ ආණ්ඩුවේ මුද්‍රණාලයේ දීය.

## ආදර්ශ ආකෘති පත්‍රය

### ෆිටර් වරයෙකුගේ තනතුරක් සඳහා ඉල්ලුම් පත්‍රය

(1) සම්පූර්ණ නම :————.

(2) ලිපිනය :————.

(3) (අ) ඉල්ලුම්කරු උපන් දිනය සහ ගම :————.
(ආ) ඉල්ලුම්කරුගේ පියා උපන් දිනය හා ගම :————.

(4) ඉල්ලුම්කරුගේ වයස : අවුරුදු :————, මාස :————.

(5) විවාහක හෝ අවිවාහක බව :————.

(6) ජාතිය—
(අ) ලාංකිකයකු නම් ලියාපදිංචි වීමෙන් ද පරම්පරාවෙන් ද යන වග :————.
(ආ) පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ඔබ ලාංකිකයකු නොවන්නෙහි නම් ලියාපදිංචි වීමෙන් ලංකා පුරවැසි බව ලබාගැනීමට රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමා වෙත ඉල්ලුම්කර යැවුවෙහි ද? මේ සම්බන්ධව ගන්නා ලද ක්‍රියා මාර්ගයක් වේ නම් ඒ පිළිබඳ විස්තර :————.

(7) (අ) ෆිටර් වරයකු වශයෙන් පළපුරුද්ද ලබා ඇති කාලය, ඒ පිළිබඳ විස්තර සහ අයදුම්කරු වැඩ කරන ලද වෙළඳ සමාගම්වල නම් :————.
(ආ) යන්ත්‍ර නඩත්තු කිරීමේ සහ අළුත්වැඩියා කිරීමේ පළ පුරුද්ද ලබා ඇති කාලය සහ අයදුම්කරු වැඩ කරන ලද වෙළඳ සමාගම්වල නම් :————.

(8) පහත සඳහන් සහතිකවල පිටපත් ඉල්ලුම් පත්‍රයට ඇමිනිය යුතුයි :—
(අ) උප්පැන්න සහතිකය ;
(ආ) අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ සහතිකය ;
(ඇ) චරිතය හා දක්‍ෂතාවයන් පිළිබඳ සහතික තුනක් ;
(ඈ) ඉහත සඳහන් අංක 7 දරණ තීරයේ කරුණු සනාථ කිරීම සඳහා යටත් පිරිසෙයින් අවුරුදු දහයක්වත් ෆිටර් කෙනෙකු හැටියට පළපුරුද්දක් ඇති බවට සහතික.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10-682

---

## ගම්බද උසාවි සභාපති තනතුරු

ඌවරට ප්‍රදේශයෙහි පුරප්පාඩුවී ඇති ගම්බද උසාවි සභාපති තනතුරු දෙකක් පිරවීමට අධිකරණ සේවා කොමිෂන් සභාව අදහස් කර සිටී. මනා සිංහල දැනුමක් ඇති ලාංකික නීතිඥවරුන්ගෙන් තනතුරු සඳහා ඉල්ලුම්පත් බාරගනු ලබන අතර ඌඩරටියන්වූ ඉල්ලුම්කරුවන්ට විශෙෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

"උඩරටියා" යන පාඨයේ පහත දක්වෙන නිරූපනය අනුව උඩරටියන් වන ඉල්ලුම්කරුවන් විසින් ඉල්ලුම් පත්‍ර පෝරමයේ කොටුවෙහි ඒ බව විශෙෂයෙන් සඳහන් කළ යුතුය.

"උඩරටියා" යන්නෙන් අදහස් කෙරෙන්නේ—

(අ) උඩරටියකු වූ පියකුගේ පුතෙක් හෝ දුවක් සහ
(ආ) මව්පියන්ගේ ස්ථිර වාසය උඩරට දිස්ත්‍රික්කයක නම්, "බින්න" හෝ "දීග" ක්‍රමයට විවාපත් උඩරට මවකගේ හෝ දුවක් ය.

ඉල්ලුම්පත් ලියා එවිය යුත්තේ, කොළඹ 12, තැ. පෙ. 573, අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ගෙන් ලබාගත හැකි, නියමිත ආකෘති පත්‍රවලය. 1960 නොවැම්බර් මස 30 වැනිදා හෝ ඊට කලින් අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තැන වෙත ලැබෙන ලෙස ඉල්ලුම්පත් එවිය යුතුය. තෝරාගනු ලැබූ අයදුම් කරුවන්ට වැටුප් ගෙවනු ලබන්නේ, රුපියල් 180 වාර්ෂික වැඩිවීම් 8 කින් හා රුපියල් 360 වාර්ෂික වැඩිවීම් 8 කින්ද රුපියල් 4,980 ක් ලැබීමටත් රුපියල් 6,240 ක් ලැබීමටත් පෙර කාර්යක්ෂමතා කඩඉම් වලින් ද සමන්විත වූ වර්ෂයකට රුපියල් 4,080 න් පටන්ගෙන රුපියල් 8,400 තෙක් නගින වැටුප් ක්‍රමයක් අනුවය. ආණ්ඩුවෙන් අනුමත කරන ලද නියෝගවලට හා ගණන් ප්‍රමාණවලට අනුකූලව ප්‍රවාහන දීමනාවක්ද ගෙවනු ලැබේ. නිවාඩු හා සෙසු සේවා කොන්දේසි අදාලවන්නේ රාජ්‍ය සේවාවට බැඳෙන නවකයන් සම්බන්ධයෙන් වූ රෙගුලාසි අනුවය. මේ තනතුරු දැරීමට සෞඛ්‍ය අතින් ඔවුන් යෝග්‍ය බැව් ඔප්පු කිරීමට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් වෛද්‍ය පරීක්‍ෂණයකින් සමත් විය යුතුය. එසේම දිවයිනේ වෙන ඕනෑම ගම්බද උසාවියක සභාපති වශයෙන් මාරු කරනු ලැබීමටද ඔවුන් යටත් විය යුතුය. පත්වීම පරීක්‍ෂණාත්මක කාල පරිච්ඡේදයකට ද යටත් වන්නේ ය.

අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලබන අයදුම්කරුවන් ඒ පරීක්‍ෂණයට පැමිණිය යුත්තේ සවකීය වියදමිනි.

එස්. ආර්. විජෙයතිලක,
අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1960 ඔක්තෝබර් මස 18 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා කාර්යාලය,
තැ. පෙ. අංකය 573,
කොළඹ 12.

10-672

අංකය : ජී. ඊ. බී. 5853.

## වාණිජ විෂයයන් ඉගැන්වීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීම

**වාණිජ විෂයයන් ඉගැන්වීම සඳහා ගුරුවරුන් වශයෙන් සේවයට බැඳීමට බලාපොරොත්තු වන්නන්ගේ නාමලේඛනයෙහි ලියා පදිංචි කිරීම සඳහා පහත දක්වන සුදුසුකම් ඇති අයගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.**

**1. නියමිත සුදුසුකම් ලබා ඇත්තවුන් නම් :** ලංකාවේ කාර්මික **විද්‍යාල දෙපාර්තමේන්තුවෙන් හෝ ලන්ඩන් චේම්බර් ඔෆ් කොමර්ස් ආයතනයේ** උසස් පෙළ වාණිජ සහතික පත්‍ර දෙක හෝ ලංකා කාර්මික විද්‍යාලයේ උසස් පෙළ වාණිජ සහතික පත්‍රය සහ කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවේ හා ලන්ඩන් චේම්බර් ඔෆ් කොමර්ස් **යන ආයතන දෙකින් එකක පහළ පෙළ සහතික පත්‍රයක් ද ලබා ඇති අය වෙත්.**

1.560—14 × 72—2,568 (කාර්යක්ෂමතා කඩඉම) 2,640—5 × 120—3,240 වූ වැටුප් ක්‍රමයක් මේ සඳහා නියමිතය.

**2. සහතික නොලත් තාවකාලික ගුරුවරුන් වශයෙන් පත්වීම් ලැබීමට පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතුයි :—**

(අ) ලංකාවේ කාර්මික විද්‍යාල දෙපාර්තමේන්තුවෙන් හෝ ලන්ඩන් චේම්බර් ඔෆ් කොමර්ස් ආයතනයෙන් හෝ ලද පොත් තබන්නන් සඳහා හෝ ලඝු ලේඛකයන් (උසස් හෝ පහළ පෙළ) සඳහා වූ වාණිජ සහතික පත්‍රය සමඟ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය. (ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ දී සිංහල භාෂාව පිළිබඳ සාමාර්ථයක් සහිතව.) හෝ

(ආ) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ දී හෝ ලන්ඩන් චේම්බර් ඔෆ් කොමර්ස් විභාගයේ දී හෝ වාණිජ අංක ගණිතය, වාණිජ ශාස්ත්‍රීය මූල ධර්ම, පොත් තැබීම, ලඝුලේඛනය හා ටයිප් ගැසීම යන විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් තුනකින් සමත්ව, ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රය (ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර හෝ පොදු අධ්‍යාපන සහතික පත්‍ර විභාගයේ දී සිංහල භාෂාව පිළිබඳ සාමර්ථයක් සහිතව.)

**මේ සඳහා** රු. 768 **ක වාර්ෂික වැටුප් ක්‍රමයක් නියමිතය.**

**මෙහි පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කර** 1960. 11. 15 වැනි දින හෝ ඊට පෙර මවෙත (ජී. ඊ. ශාඛාව) **ලැබෙන සේ ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර ඇතුළත් ලියුම් කවරයේ** "ජී. ඊ. වාණිජ ගුරුවරු" යන්න සඳහන් **කළ යුතුයි.**

### වාණිජ විෂයයන් ඉගැන්වීම පිණිස ගුරුවරුන් වශයෙන් ලියා පදිංචි කිරීම සඳහා ඉල්ලුම් පත්‍රය

1. **සම්පූර්ණ නම :**————.
   - (අ) පෙළපත් නාමය (පැහැදිලි අකුරෙන්) මහත්මයා/මහත්මී/මෙනෙවිය :————.
   - (ආ) අනික් නම් :————.
2. 1961 ජනවාරි 1 වැනි දිනට වයස : අවුරුදු———මාස———. (උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණන්න)
3. ස්ථිර ලිපිනය :————.
4. ඉල්ලුම්කරුගේ ජාතිය (ලාංකිකයෙකු නම් ලියාපදිංචි කිරීමෙන් ද, පරම්පරාවෙන් ද යන වග) :————.
5. දැන් කරන රක්ෂාව විස්තර සහිතව :————.
6. ඉහත සඳහන් කරන ලද සුදුසුකම් ලබාගත් දින (සහතික පත්‍රවල පිටපත් අමුණන්න) :————.
7. මෑතදී චරිත සහතික දෙකක් ලබාගත් තැනැත්තන් දෙදෙනෙකුගේ නම් හා ලිපින (එවැනි සහතික පත්‍රවල පිටපත් අමුණන්න) :————.
8. **යම්කිසි වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේ ද? ඒ සම්බන්ධ විස්තර හා දින සඳහන් කරන්න :————.**

**මවිසින් ඉහත සඳහන් කරන්නට යෙදූ පිළිතුරු සත්‍ය බවට සහතික කරමි.**

ඉල්ලුම්කරුගේ අත්සන :————.

දිනය :————.

**මීට කලින් ඉල්ලුම්පත් ඉදිරිපත් කරන ලද අයදුම් කරුවන් හට නැවතත් මේ නිවේදනය අනුව ඉල්ලුම් පත් ඉදිරිපත් කරන ලෙස මෙයින් දනුම් දෙමි.**

ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කළ යුත්තේ "අධ්‍යාපන අධ්‍යක්ෂ, ජී. ඊ. ශාඛාව, මලයි වීදිය, කොළඹ 2" යන ලිපිනයට ය.

එස්. එෆ්. ද සිල්වා,
අධ්‍යාපන අධ්‍යක්ෂ.

අධ්‍යාපන දෙපාර්තමේන්තුව,
කොළඹ-2,
1960 ඔක්තෝබර් 10 වැනි දින.

10-678.

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### දෙවන ශ්‍රේණියේ නිර්මාණ ඕවර්සියර් වරුන්ගේ තනතුරු

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ දෙවන ශ්‍රේණියේ නිර්මාණ ඕවර්සියර් වරුන්ගේ තනතුරු සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ.

2. පහත සඳහන් ආදර්ශ පෝරමයෙහි ඉල්ලුම්කරුගේ අත් අකුරින්ම ලියූ ඉල්ලුම් පත්‍ර 1960 නොවැම්බර් මස 12 වෙනි දින දවල් 12 ට පෙර මා වෙත ලැබිය යුතුයි.

3. තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 750—42—1,086කි.

4. **සේවය පිළිබඳ කොන්දේසි :—**

(i) තනතුරු තාවකාලිකය. විශ්‍රාම වැටුප් රහිතය. පත්වීම පළමුවෙන් හය මාසයක පරීක්ෂා කාලය උඩ හා රු. 2.10—12—3.18 යන දෛනික වැටුප් ක්‍රමය උඩ වේ.

(ii) තෝරා පත්කර ගනු ලැබුවන් කෙටි දැන්වීම් කාලයකදී පත්වීමේ වැඩ භාර ගත යුතුයි. ඔවුන් ක්ෂේත්‍ර නිලධාරීන් සේ ගැණෙන අතර, අතිරේක දීමනාවන් නොමැතිව ප්‍රසිද්ධ නිවාඩු දිනයන්හි වැඩ කිරීම අවශ්‍ය වේ.

5. **අවශ්‍ය සුදුසුකම් :—**

(i) සිංහල හෝ දෙමළ හෝ ඉංග්‍රීසි කණිෂ්ඨ සහතික පත්‍ර විභාගයෙන් සාමාර්ථය ;

(ii) 60.11.1 වැනි දිනට වයස අවුරුදු 21 ට නොඅඩු හා 40 ට නොවැඩි වීම ;

(iii) පිරිසිදු චරිතය හා ශාරීරික සුදුසුකම ;

(iv) ගොඩනැගිලි නිර්මාණය පිළිබඳ දැනීම.

6. ඉල්ලුම් කරුවන් තම ඉල්ලුම් පත්‍ර වලට පහත සඳහන් සහතිකයන්හි පිටපත් ඇමිණිය යුතුයි. මුල් සහතික එවීම අනවශ්‍යය :—

(i) උප්පැන්න සහතිකය ; (බව්තීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්යයන් සඳහා නිකුත් කරන ලද සහතිකය භාරගනු නොලැබේ.)

(ii) ශාස්ත්‍රාලයීය හා කාර්මික සුදුසුකම් ලබා ඇතොත් ඒවායේ උසස් විභාගයන්හි පිටපත් ;

(iii) ඉල්ලුම් කරුගේ අධ්‍යාපනය, චරිතය හා පත්වීමට සුදුසු බවට මෑතකදී ලබාගත් සහතික පිටපත් 3ක්.

**සැලකිය යුතුයි.**—මෙම සහතික පිටපත් ආපසු එවනු නොලැබේ.

7. මේ සම්බන්ධයෙන් ඉල්ලුම් පත්‍ර හා අනෙක් දැන්වීම් එවිය යුත්තේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනට මිස, දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකුගේ පුද්ගලික නමට නොවේ.

8. තෝරා පත්කර ගන්නා අපේක්ෂකයින් මාස්පතා රු. 10 යේ ගෙවීම් ක්‍රමයට රු. 500 ක ඇපයක් තැන්පත් කළ යුතුයි.

9. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡෙදයේ මුළ පළවූ රාජ්‍ය සේවාවේ තනතුරු වලට කරන පත්කිරීම් පිළිබඳ පොදු කොන්දේසි බලනු මැනවි.

10. මෙම සුදුසුකම් නොමැති අපේක්ෂකයින්ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොලැබේ.

11. ඉල්ලුම් පත්‍ර ලැබුනු බව දන්වා එවනු නොලැබේ.

ඩබ්ලිව්. ආර්. පී. තිලකරත්න,
ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ වෙනුවට.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
කොළඹ 1, 1960 ඔක්තෝබර් 24 දින.

### ආදර්ශ පෝරමය

**දෙවන ශ්‍රේණියේ නිර්මාණ ඕවර්සියර් තනතුරු සඳහා ඉල්ලුම් පත්‍රය**

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.
2. ලිපිනය :————.
3. ජාතිය :————.
   (පරම්පරාවෙන් ද ලියා පදිංචි කිරීමෙන් ද යන වග සඳහන් කරන්න)

4. උපන් ස්ථානය :————.

5. උපන් දිනය හා 60.11.1 වැනි දිනට නියම වයස :————.
(උප්පැන්න සහතිකයෙහි පිටපතක් ඇමිණිය යුතුයි.)

6. අධ්‍යාපන සුදුසුකම් :————.
(සහතික වල පිටපත් ඇමිණිය යුතුයි)

7. පාසැලෙන් අස්වූවාට පසු කළ රැකියාව :————.

8. කාර්මික සුදුසුකම් හා නිර්මාණ වැඩ පිළිබඳ දැනීමේ විස්තර : ————.

9. දැනට කරන රැකියාව (තිබේ නම්) :————.

10. සහතික අමුනා ඇති තිදෙනාගේ නම් හා ලිපිනය :————.
(1) :————.
(2) :————.
(3) :————.

————,
අත්සන.

දිනය :————.

10-825

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බාලිකා මහා විද්‍යාලය, කාසල් වීදිය

**1961 වර්ෂයට ශිෂ්‍යාවන් ඇතුළත් කර ගැනීම පිළිබඳ නිවේදනයයි**

කොළඹ කාසල් වීදියේ බාලිකා මහා විද්‍යාලයට ශිෂ්‍යාවන් ඇතුළත් කිරීමට අපේක්ෂාකරන්නවුන් ප්‍රධාන ගුරුතුමියගෙන් පෝරුම් කොළ ලබාගත යුතුයි.

2. සෑම ප්‍රවේශ පත්‍රයක්ම නොවැම්බර් මස 3 වෙනි බ්‍රහස්පතින්දා දවල් 12 පෙර ප්‍රධාන ගුරුතුමිය වෙත ලැබීමට සැලැස්විය යුතුයි.

3. කලා හා විද්‍යා විෂයයන් උගන්වන, පහත සඳහන් පංතිවලට බාලිකාවන් බාරගනු ලැබේ :—

කලා—ජ්‍යෙෂ්ඨ පුහුණුවීමේ පන්තිය—සිංහල මාධ්‍යය—1.1.45 හෝ ඊට පසු උපන් අය.

විශ්ව විද්‍යාල ප්‍රවේශ පන්තිය 1 වන අවුරුද්ද—සිංහල මාධ්‍යය—1.1.41 හෝ ඊට පසු උපන් අය.

විද්‍යා—ජ්‍යෙෂ්ඨ පුහුණුවීමේ පන්තිය—ඉංග්‍රීසි මාධ්‍යයය—1.1.45 හෝ ඊට පසු උපන් අය.

ජ්‍යෙෂ්ඨ මධ්‍යම පන්තිය—ඉංග්‍රීසි මාධ්‍යයය—1.1.44 හෝ ඊට පසු උපන් අය.

විශ්ව විද්‍යාල ප්‍රවේශ—ඉංග්‍රීසි මාධ්‍යය—1 අවුරුද්ද—1.1.41 හෝ ඊට පසු උපන් අය.

4. ජ්‍යෙෂ්ඨ හා විශ්ව විද්‍යාල ප්‍රවේශ අවසාන අවුරුදු පංතිවල ඇබෑර්තු නැත. ඇතුළත් වීමේ පරීක්ෂණය නොවැම්බර් මස 5 වැනි සෙනසුරාදා පෙරවරු 8.30ට විදුහල් ශාලාවේදී පවත්වනු ලැබේ.

විශ්ව විද්‍යාල ප්‍රවේශ—1 වෙනි අවුරුදු පන්තියට ඇතුළත් වීමට අදහස් කරන ශිෂ්‍යාවන් අවශ්‍ය සම්මාන සමග ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමර්ථවී තිබිය යුතුයි.

ප්‍රධානාචාර්‍ය්‍යා.

10-683

---

## තර්ස්ටන් මහා විද්‍යාලය, තර්ස්ටන් පාර, කොළඹ 3.

**ඇතුළත්වීමේ විභාගය—1960 නොවැම්බර් 19 වෙනි සෙනසුරාදා**

අයදුම්පත් 1960 නොවැම්බර් 10 වෙනි බ්‍රහස්පතින්දාට පෙර එවිය යුතුයි. ඒ සඳහා ආකෘති පත්‍ර විද්‍යාලයාධිපතිගෙන් ලබා ගත හැක.

පුරප්පාඩු ඇතිවන්නේ 6 වැනි පන්තියෙහිය— මාධ්‍යය සිංහල.

1961 ජනවාරි 1 දිනට තිබිය යුතු වයස.

අවුරුදු 10, මාස 6 සිට අවුරුදු 11 මාස 6 දක්වා.

**අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයයන්ගෙන් පරීක්ෂා කරනු ලැබේ :—**

සිංහල භාෂාව, ඉංග්‍රීසි භාෂාව, අංක ගණිතය (සිංහල).

5 වැනි පන්තියේ ඉගෙනීම ලබන ළමයින්ට මෙම විභාගයට පෙනී සිටිය හැකි නමුත් 6 වැනි පන්තියට ඇතුළත්කර ගත හැක්කේ 5 වැනි පන්තියෙන් සමර්ථවූ අය පමණයි.

එම්. ඩී. ගුණවර්ධන,
විද්‍යාලයාධිපති.

දිනය : 28.9.60.

10-707

---

භාණ්ඩාගාරයේ අංකය : 1/60/8(ජී).

## ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (ඉංග්‍රීසි) විභාගය—1959 දෙසැම්බර්

වර්ෂ 1959 යේ දෙසැම්බර් මස 30 වැනි දින පවත්වනු ලැබූ ටයිප් ගසන්නන්ගේ සේවයට බඳවා ගැනීමේ (ඉංග්‍රීසි) විභාගයේ ප්‍රතිඵල අනුව පහත නම් සඳහන් අපේක්ෂක අපේක්ෂිකාවන් ටයිප් ගසන්නන්ගේ සේවයට පත් කර ගැනීමට තෝරා ගනු ලැබූ බැව් මෙයින් දනුම් දෙමි :—

| නම | ලිපිනය |
|---|---|
| අබයරත්න, එම්. ඩී. ... | 1 වන අංශය, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ. |
| අබේගුණවර්දන, ඊ. ... | රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, කොළඹ 1. |
| අමරසිංහ, බී. ... | පළාත් පාලන දෙපාර්තමේන්තුව, මහ ලේකම් කාර්යාලය, කොළඹ. |
| අමරසේකර, පී. සී. ... | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 1. |
| අරුනාචලම්, පී. (මෙනවිය) | ලඝු ලේඛන ශාඛාව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, කොළඹ 1. |
| අල්විස්, එම්. බී. එම්. ... | ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලය, මීගමුව. |
| අලවත්ත, සී. ... | තැ. පෙ. 1225, කොළඹ. |
| ඇලෙක්ස්ටන්, ඩබ්ලිව්. ... | ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව, 330, යූනියන් පෙදෙස, කොළඹ 2. |
| කන්නන්ගර, පී. ඩී. ඒ. ... | ඉඩම් සංවර්ධන කාර්යාලය, 3 කිංග්ස් වීදිය, බදුල්ල. |
| කරදවල, අයි. (මහත්මිය). | ගණන් ශාඛාව, වෙළඳ අංශය, ගුවන් විදුලි දෙපාර්තමේන්තුව, කොළඹ 7. |
| කරදවල, එස්. (මෙනවිය). | 78, සුදුහුම්පොල, මහනුවර. |
| කරුණාතිලක, එම්. වී. කේ. (මෙනවිය) ... | 305, "චන්දන", මොරකැටිය, පන්නිපිටිය. |
| කරුණාදාස, ජේ ඩී. ... | ගොවිජන සේවා දෙපාර්තමේන්තුව, 60, හෝටන් පෙදෙස, කොළඹ 7. |
| කරුණානායක, ඩී. පී. එස්. | කම්කරු දෙපාර්තමේන්තුව, 21 චොක් ෂෝල් වීදිය, කොළඹ 2. |
| කුරුප්පු, එල්. පී. (මෙනවිය) ... ... | 18, පෙනික්වික් පාර, කොළඹ 6. |
| කුරේ, එම්. එම්. සී. (මෙනවිය) ... ... | පාර්ලිමේන්තු අල්ලස් කොමිෂම, 125, මැකාති පාර, කොළඹ 7. |
| කුලරාසන්, කේ. ... | ඇටෝර්නි ජනරාල්ගේ දෙපාර්තමේන්තුව, කොළඹ 12. |
| කොඩිකාර, බී. කේ. (මෙනවිය) ... ... | 39, ලයිට්හවුස් වීදිය, කොටුව, ගාල්ල. |
| කාෂස්, පී. ... | රාජ්‍ය ආරක්ෂක හා විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය, කොළඹ 1. |
| ගුණරත්න, සී. එන්. ... | 45/1, ජාවත්ත පාර, කොළඹ 5. |
| ග්‍රෙගරි, එච්. ජේ. ... | දිස්ත්‍රික්ක ඉංජිනේරු කාර්යාලය, (මධ්‍යම දිස්ත්‍රික්කය), දුම්රිය දෙපාර්තමේන්තුව, දෙමටගොඩ. |
| චන්ද්‍රරත්න, එන්. ජී. එල්. | නියෝජ්‍ය අධ්‍යක්ෂගේ කාර්යාලය, ජල සම්පාදන් වැඩ පිළිබඳ උප දෙපාර්තමේන්තුව, රජයේ වැඩ දෙපාර්තමේන්තුව, රත්මලාන. |
| චන්ද්‍රසිරි, ආර්. ඒ. ... | 106, අමුණුගොඩ, ඉඹුල්ගොඩ. |
| චන්ද්‍රසේන, එල්. වී. ... | ඒ. එස්. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2. |
| ජයතිලක, ඊ. ... | ප්‍රධාන ගණකාධිකාරි කාර්යාලයය, දුම්රිය දෙපාර්තමේන්තුව, කොළඹ 10. |
| ජයරාජා, එස්. එම්. ... | 22, කැතිඩ්‍රල් පාර, ත්‍රිකුණාමලය. |
| ජයසිංහ, ඒ. (මෙනවිය). | එස්. ඩබ්ලිව්. ශාඛාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව, මැලේ වීදිය, කොළඹ 2. |
| ජයසිංහ, ඩී. බී. ... | ඔඩිටර් ජනරාල්ගේ දෙපාර්තමේන්තුව, ටොරින්ටන් චතුරශ්‍රය, කොළඹ 7. |
| ජෝශප්, සී. අයි. එම්. (මෙනවිය) ... | "මෙන්ඩිවිනෝ", කොරවැල්ල, මොරටුව. |
| ඩයස්, එම්. පී. ජේ. එච්. (මෙනවිය) ... | කම්කරු දෙපාර්තමේන්තුව, පහල වැව පාර, කොළඹ 3. |
| ඩයස්, බී. ... | එෆ්. පී. ශාඛාව, ප්‍රධාන කාර්යාලය, රජයේ වැඩ දෙපාර්තමේන්තුව, කොළඹ 1. |
| ඩෙප්, ඩබ්ලිව්. ඩී. පී. (මෙනවිය) ... | ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව, කොළඹ 7. |
| ද මෙල්, ඩබ්ලිව්. එන්. එච්. | ප්‍රධාන මහෙස්ත්‍රාත් උසාවිය, කොළඹ 12. |
| ද ලිවේරා, අයි. එම්. (මෙනවිය) ... ... | ජල සම්පාදන කටයුතු පිළිබඳ උප දෙපාර්තමේන්තුව, රජයේ වැඩ දෙපාර්තමේන්තුව, රත්මලාන. |

# ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### අයි. සී. ඒ. ටෙන්ඩර් දැන්වීමයි

අධ්‍යාපන හා ගුවන් විදුලි පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 දෙසැම්බර් 23 වැනි දින පෙරවරු 10.30 දක්වා අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| ද්‍රව්‍යය | ටෙන්ඩර් අංකය |
|---|---|
| (1) උෂ්ණ මානයන් හා වෙනත් විද්‍යා රසායනාගාර උපකරණ | අයි. සී. ඒ.—293 |
| (2) ගෑස් ජනකයන් | අයි. සී. ඒ.—294 |
| (3) භූමිතෙල් උදුන් | අයි. සී. ඒ.—295 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැන ගෙන් ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් පෝරම ලබා ගැනීමට පෙර ටෙන්ඩර්කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන් ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඩු. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරි.

1960 ඔක්තෝබර් 22 වෙනි දින,
කොළඹ 2.

10-829

## සුරාබදු දෙපාර්තමේන්තුව

මහනුවර සුරාබදු ප්‍රහාරක හමුදාව භාර, සහකාර සුරාබදු කොමසාරිස් තුමා විසින් පහත සඳහන් ස්ථානයන්හි ඇති සේවයට අයෝග්‍ය අංක සී. ඇන්. 6800, ඊ. වයි. 7661 හා ඊ. වයි. 7990 දරණ දෙපාර්තමේන්තුව සතු ලෑන්ඩ් රෝවර් රථ විකිණීම සඳහා 1960 නොවැම්බර් මස 21 වෙනි සඳුදා උදේ 9.30 දක්වා ටැන්ඩර් භාරගනු ලැබේ:—

සී. ඇන්. 6800—කුරුණෑගල, සුරාබදු ප්‍රහාරක ස්ථානය.

ඊ. වයි. 7661—රත්නපුරේ, සුරාබදු ප්‍රහාරක ස්ථානය.

ඊ. වයි. 7990—බදුල්ලේ, සුරාබදු ස්ථානය.

එක එක වාහනයට වෙන් වෙන් වශයෙන් එවියයුතු ටැන්ඩර් පිටපත් දෙකකින් යුක්තවිය යුතුයි. මේ සඳහා නියමිත ආකෘති පත්‍ර 1960 නොවැම්බර් 19 වෙනි සෙනසුරාදා දවල් 12 දක්වා මහනුවර, සුරාබදු ප්‍රහාරක හමුදාව භාර සහකාර සුරාබදු කොමසාරිස් තුමාගෙන් ලබාගත හැකිවනවාත් මෙන්ම අවශ්‍ය සියළුම විස්තරද ඔහුගෙන් දැනගත හැක.

කොළඹ 6, සැවොයි ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් තැනට, කච්චේරියකට හෝ මහනුවර, සුරාබදු ප්‍රහාරක හමුදව භාර සහකාර සුරාබදු කොමසාරිස් තැනට එක වාහනයකට රුපියල් (රු. 100) සියය බැගින් ගෙවා ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් පසුව ටැන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනවා ඇත.

ඊ. බී. වඩුගොඩපිටිය,
සුරාබදු කොමසාරිස්.

1960 ඔක්තෝබර් 20 වැනිදා,
කොළඹ 6, සැවොයි ගොඩනැගිල්ලේ
සුරාබදු කොමසාරිස් තැනගේ කාර්යාලය.

10-853

## ලුණු දෙපාර්තමේන්තුව

### බීමට ජලය සැපයීම

1961 ජනවාරි 1 වැනි දින පටන් 1961 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා පුත්තලමේ නැගෙනහිර සහ බස්නාහිර ලුණු ලේවායන්හි නියුක්ත කාර්ය මණ්ඩලයට බීමට සුදුසු ජලය සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1960ක්වූ නොවැම්බර් මස 18 වැනි දින පස්වරු 3. වන තුරු කොළඹ කොම්පඤ්ඤ වීදියේ 110, ජෙනරල්ස් ලේක් පාරේ තැ. පෙ. නො. 539 දරණ ලුණු කොමසාරිස් තැන විසින් භාරගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනු පිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ පුත්තලමේ ආණ්ඩුවේ දිසාපතිතැන ගෙන් හෝ පුත්තලමේ ලුණු අධිකාරිතැනගෙන් ලබාගන්නා පෝරම කොළ වලය. ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 25ක් ඕනෑම කච්චේරියක හෝ ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙහි බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කල විට ටෙන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ. වැඩි විස්තර ඉහත සඳහන් අයගෙන් ලබාගත හැක.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

අංකය : ඊජී 189.
1960 ඔක්තෝබර් මස 28 වැනි දින,
කොළඹ.

10-764

## ලුණු දෙපාර්තමේන්තුව

### පොල් අතු සැපයීම

වර්ෂ 1961 ජනවාරි මස 1 වැනි දින සිට 1961 දෙසැම්බර් 31 වැනි දින දක්වා ඇලිපන්ට් පාස් ලුණු ලේවායට පොල් අතු (ඉරු දෙකේ) 3,00,000 ක් පමණ සැපයීම සහ ගෙනත් භාරදීම සඳහා ටැන්ඩර් පත්‍ර කොළඹ නව මහ ලේකම් ගොඩනැගිල්ලේ තැ: පෙ: 570 දරණ කම්හාන්ත, සවදේශ හා සංස්කෘතික අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1960 නොවැම්බර් මස 23 වැනි බදාදා දවල් 12 වන තුරු භාරගනු ලැබේ.

ටැන්ඩර් පත්‍ර සැපයිය යුත්තේ අනුපිටපත සමග ලුණු කොමසාරිස් තැනගේ කාර්යාලයෙන් හෝ යාපනේ ආණ්ඩුවේ දිසාපති තැනගෙන් හෝ ඇලිපන්ට් පාස් ලුණු අධිකාරි තැනගෙන් ලබා ගන්නා පෝරම කොළවලය. ටැන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රු. 50ක් ඕනෑම කච්චේරියක බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටැන්ඩර් පෝරම කොළ දෙනු ලැබේ.

ඊ. බී. තිසවීරසිංහ,
ලුණු කොමසාරිස්.

අංකය : ඊ. ජී. 8.
1960 ඔක්තෝබර් 28 වැනි දින,
කොළඹ.

10-765

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දකුණු කොට්ඨාශය භාර තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් ගාළු දිස්ත්‍රික්කයේ පිහිටි පිතිකගහ ඇල වාරිමාර්ග ව්‍යාපාරය තැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 25,000 කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 වේ නොවැම්බර් මස 22 වෙනි දින පෙරවරු 10 දක්වා ඉල්ලුම් පත්‍ර භාර ගනු ලැබේ.

1960 නොවැම්බර් මස 14 වෙනි දින සිට 19 වෙනි දින දක්වා කාර්යාලීය වේලාවන් හිදී ඉල්ලුම් පත්‍ර පහත අත්සන් කරන මා විසින් නිකුත් කරනු ලැබේ. ඉල්ලුම් පත්‍ර ලබා ගැනීමට පෙර එක ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් රු. 25 ක් කච්චේරියක හෝ මෙම කාර්යාලයේ හෝ තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත් කරුවන් ඉල්ලුම් පත්‍ර ලබාගැනීමට ඉදිරිපත් වන අවස්ථාවේදී ස්ථටක් පොත් ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම ඔවුන් දැනට රජයේ කොන්ත්‍රාත් වැඩෙහි යෙදෙන්නේ නම් ඒ වැඩ පිළිබඳ සහතිකයක් ඒ භාර නිලධාරීන් ගෙන් ලබා ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා මගෙන් විමසන්න.

ඇම්. සී. බී. මැන්දිස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
ගාළු උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල, 1960.10.20

10-594

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දකුණු කොට්ඨාශය භාර තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතර දිස්ත්‍රික්කයේ ඌරුපොල ව්‍යාපාරය උදෙසා අතිරේක අමුනක් තැනීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 50,000 ට හෝ ඊට වැඩි වශයෙන් ලියාපදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960 නොවැම්බර් මස 22 වෙනි දින පෙරවරු 10 දක්වා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

1960 නොවැම්බර් මස 14 වෙනි දින සිට 19 වෙනි දින දක්වා කාර්යාලීය වේලාවන් හිදී පහත අත්සන් කරන මා විසින් ඉල්ලුම් පත්‍ර නිකුත් කරනු ලැබේ. ඉල්ලුම් පත්‍ර ලබා ගැනීමට පෙර එක ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් රු. 50ක් කච්චේරියක හෝ මෙම කාර්යාලයේ හෝ තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය.

කොන්ත්‍රාත්කරුවන් ඉල්ලුම් පත්‍ර ලබාගැනීමට ඉදිරිපත් වන අවස්ථාවේදී සටහන් පොත් ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම ඔවුන් දැනට රජයේ කොන්ත්‍රාත් වැඩෙහි යෙදෙන්නේ නම් ඒ වැඩ පිළිබඳ සහතිකයක් ඒ භාර නිලධාරීන්ගෙන් ලබා ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා මගෙන් විමසන්න.

ඇම්. සී. බී. මැන්දිස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
ගාලු උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල, 60.10.14.

10-762

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

දකුණු කොට්ඨාශය භාර තංගල්ලේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතර දිස්ත්‍රික්කයේ අලවතුගොඩ අමුන ව්‍යාපාරයට ඉස්සිය හැකි දොරවල් සවි කිරීම සහ වැඩි දියුණු කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රු. 30,000කට හෝ ඊට වැඩි වශයෙන් ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ගෙන් 1960 නොවැම්බර් මස 22 වෙනි දින පෙරවරු 10 දක්වා ඉල්ලුම් පත්‍ර භාරගනු ලැබේ.

1960 නොවැම්බර් මස 14 වෙනි දින සිට 19 වෙනි දින දක්වා කාර්යාලීය වේලාවන්හිදී පහත අත්සන් කරන මා විසින් ඉල්ලුම් පත්‍ර නිකුත් කරනු ලැබේ. ඉල්ලුම් පත්‍ර ලබා ගැනීමට පෙර එක ඉල්ලුම් පත්‍රයක් වෙනුවෙන් රු. 50ක් කච්චේරියක හෝ මෙම කාර්යාලයේ හෝ තැන්පත් කොට කුවිතාන්සිය ඉදිරිපත් කළ යුතුය. කොන්ත්‍රාත්කරුවන් ඉල්ලුම් පත්‍ර ලබාගැනීමට ඉදිරිපත් වන අවස්ථාවේදී සටහන් පොත් ඉදිරිපත් කළ යුතුවාක් මෙන්ම ඔවුන් දැනට රජයේ කොන්ත්‍රාත් වැඩෙහි යෙදෙන්නේ නම් ඒ වැඩ පිළිබඳ සහතිකයක් ඒ භාර නිලධාරීන්ගෙන් ලබා ඉදිරිපත් කළ යුතුය. වැඩි විස්තර සඳහා මගෙන් විමසන්න.

ඇම්. සී. බී. මැන්දිස්,
වාරිමාර්ග ඉංජිනේරු තැන,
ගාලු උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
ගාල්ල, 60.10.14.

10-763

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ කොට්ඨාශය භාර කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1960 නොවැම්බර් මස 16 වැනි බුද දින පෙරවරු 9.30 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කයේ දැදුරු ඔය ව්‍යාපාරය යටතේ බතලගොඩ වැකන්දේ පහළ කෙළවරෙහි ගල් ඇහිරීම සහ ජලය බැස්යාමේ කානුවක් සෑදීම සඳහා ටෙන්ඩර් භාරගනු ලැබේ.

2. කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරුතැනගෙන් ලබාගත් ෆෝර්ම පිටපත් දෙකක ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. මෙම ෆෝර්ම නිසි ලෙස පුරවා, කොන්ත්‍රාත්කරුවන්ගේ අත්සන සහ දෑතම යොදා සීල් තබන ලද කවරයක බහා එවිය යුතුය. මෙම ටෙන්ඩර් කුරුණෑගල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතැන වෙත ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. නොඑසේ නම් එතුමාගේ කාර්යාලයෙහි ඇති " ටෙන්ඩර් පෙට්ටියෙහි " තැන්පත් කළ යුතුය.

3. කුරුණෑගල වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් ටෙන්ඩර් ෆෝර්ම නිකුත් කරනු ලබන්නේ 1960 නොවැම්බර් මස 15 වැනි දින පස්වරු 3 දක්වා පමණි. මෙම දෙපාර්තමේන්තුවේ රු. 20,000 හෝ ඊට වැඩි මුදලකට ලියාපදිංචි වී ඇති බව ඔප්පු කළ හැකි කොන්ත්‍රාත් කරුවන්ට පමණක් මෙම ෆෝර්ම ලබාගත හැක. මෙම ෆෝර්ම ලබා ගැනීමේදී රු. 25 මුදලක් තැන්පත් කොට ඒ සඳහා කුවිතාන්සි ඉදිරිපත් කළ යුතුය.

ඇන්. ටී. කෝට්ටෙගොඩ,
වාරිමාර්ග ඉංජිනේරුතැන,
කුරුණෑගල උප කොට්ඨාශය.

වාරිමාර්ග කාර්යාලය,
කුරුණෑගල.

10-595

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

වයඹ පළාතේ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් නිකවැරටිය උප කොට්ඨාශයේ මාගල්ල වැවේ පැන්නුම ඉස්වීම සඳහා මෙම දෙපාර්තමේන්තුවේ රුපියල් 17,000කට හෝ ඊට වැඩියෙන් ලියා පදිංචිවී සිටින කොන්ත්‍රාත්කරුවන්ගෙන් වර්ෂ 1960 නොවැම්බර් මස 16 වෙනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ.

ටෙන්ඩර් ආකෘතිපත්‍ර හා මේ පිළිබඳ වැඩි විස්තර නිකවැරටිය උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැනගෙන් 1960 නොවැම්බර් මස 14 වෙනි සඳුදා දක්වා ලබාගත හැක. ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කරන කොන්ත්‍රාත්කරුවන් විසින් නිකවැරටිය වාරිමාර්ග කාර්යාලයේ හෝ කච්චේරියක මෙම වැඩය සඳහා රුපියල් 25ක මුදලක් තැන්පත් කළ බවට රිසිට් පත් ඉදිරිපත් කළ යුතුය.

ඇල්. බී. ඇම්. ප්‍රනාන්දු,
නිකවැරටිය උප කොට්ඨාශ භාර
වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලය,
නිකවැරටිය,
1960.10.17.

10-626.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

උතුරු මැද පළාත භාර අනුරාධපුර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මෙහි පහත සඳහන් වැඩ සඳහා 1960 නොවැම්බර් මස 23 වැනි බදාදා පෙරවරු 10 වන තෙක් වෙන් වෙන් වශයෙන් ටැන්ඩර් භාරගනු ලැබේ :—

(අ) අනුරාධපුර උප කොට්ඨාශයට අයත් වන්නියන්කුලමේ ඉදිකෙරෙන ප්‍රාදේශීය වාරි මාර්ග ගොඩනැගිල්ලේ වහලේ සහ ගොඩනැගිල්ලේ ඉතිරි වැඩ නිම කිරීම.

(ආ) අනුරාධපුර උප කොට්ඨාශයට අයත් වන්නියන්කුලමේ ගැලම් 20,000හක වතුර ටැන්කියක් සහ ඊට කුළුනු ඉදි කිරීම.

(ඇ) මහකනදරාවේ වැවේ වම් ඉවුරේ ට්‍රැක් III අංක 8, 9 සහ 10 යන ඇලවල්වල හතරැස් බෝක්කු, වතුර බෙදා හරින හොරොව් සහ ෆ්ලේල් ඉදිකිරීම.

2. මෙම ටැන්ඩර් සඳහා දෙපාර්තමේන්තුවේ රුපියල් 20,000 හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත් කරුවන් සුදුස්සෝ වෙත්.

3. සෑම ටැන්ඩරයක්ම පිටපත් දෙකකින් යුක්ත විය යුතුය. මේ සඳහා ෆෝර්ම කොල සහ සියළු විස්තර මිහින්තලේ, මහකනදරාව වාරි මාර්ග ඉංජිනේරු තැනගෙන් ලබා ගත හැකිය. 1960 ඔක්තෝබර මස 31 වැනි දින සිට 1960 නොවැම්බර මස 21 වැනි දින දක්වා ෆෝර්ම කොල නිකුත්කරනු ලැබේ.

4. ටැන්ඩර් ෆෝර්ම කොල දෙනු ලබන්නේ කච්චේරියක හෝ මහකනදරාව වාරි මාර්ග කාර්යාලයෙහි රුපියල් 25 ක් තැන්පත් කර කුවිතාන්සියක් ඉදිරිපත් කරන දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වූ බවට සහතික පෙන්විය හැකි කොන්ත්‍රාත්කරුවන්ට පමණි. දැනට දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් කරන කොන්ත්‍රාත් කරුවෙකු වෙතොත් ඔහුගේ වැඩ සතුටුදායක බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතුයි.

5. ටැන්ඩර් භාරගැනීම අවසන් කරන දිනා පෙරවරු 10 ට අනුරාධපුර ප්‍රාදේශීය වාරි මාර්ග ඉංජිනේරු තුමා විසින් ටැන්ඩර් විවෘතකර බලන අවස්ථාවේ ටැන්ඩර්කරුවකට පැමිණ සිටිය හැක.

ඩී. වී. ඒ. සේනාරත්න,
වාරි මාර්ග ඉංජිනේරු.

1960 ඔක්තෝබර් මස 20 වැනි දින,
මහකනදරාව උප කොට්ඨාශය,
මිහින්තලේ.

10-761

---

උතුරු මැද කොටස භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මෙම දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත් කරුවන් ගෙන් පහත සඳහන් වැඩ සඳහා 1960 නොවැම්බර් මස 16 වෙනිදා උදය 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ :—

2. (i) කිරිගොල්ලෑව මුවඇටගම වැව දියුණු කිරීම.
(ii) නාච්චාදූවේ ස්ථිර කම්කරු නිවාසයක් තැනීම.

3. පළමුවන කාර්‍ය සඳහා රු.. 40,000 වද, දෙවෙනි කාර්‍ය සඳහා රුපියල් 15,000 වද කොන්ත්‍රාත්කරුවෙක් ලියාපදිංචි වී සිටිය යුතුය.

ටෙන්ඩර් පත්‍ර 1960 නොවැම්බර් මස 14 වෙනිදා අපරභාග 4 තෙක් නිකුත් කරනු ලැබේ. අනුරාධපුර වාරිමාර්ග ඉංජිනේරු තුමාගෙන් මේ පිළිබඳ වැඩි විස්තර ලබාගත හැක.

10-766.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් සියළුම මිළ ගණන් යටත් පිරිසෙයින් සති තුනකටවත් වෙනස් නොවන ස්ථිර ඒවා විය යුතු ය.

11. කිසියම් ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර්පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේත් ටෙන්ඩර් පත්‍රයක කිසියම් කොටසක් පිළි ගැනීමේත් බලය කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත තබාගනු ලැබේ.

12. පත්කරගනු ලැබූ ටෙන්ඩර්කරුවා විසින් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් වැඩය කිරීම සඳහා ලාංකික කම්කරුවන් පමණක් ගත යුතුයි. "ලාංකික" යන වචනයේ අර්ථය නම් පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් හෝ ලංකාවේ පුරවැසියෙක් වූ තැනැත්තෙක් යන්නයි.

13. කොන්ත්‍රාත්කාරයාට භාරදිය යුතු සියලුම දැන්වීම් ඔහුගේ අතට දුන්නොත් හෝ ඔහු විසින් සඳහන් කර ඇති, ලිපිනයට තැපෑලෙන් යැව්වොත් හෝ ඔහු අතටම දුන්නාසේ සලකනු ලැබේ.

14. 1934රේ 19 වැනි අංකය දරණ කම්කරුවන්දී ආඥාපනත (117 වැනි පරිච්ඡෙදය) යටතේ තමාගේ යම්කිසි සේවකයෙකු හෝ සේවක යෙකු වෙනුවෙන් හෝ වන්දි ඉල්ලා එන ඉල්ලුම් පත්‍ර ගැන විරුද්ධ වීමේ හෝ ඕනෑම කම්කරුවෙකු වැඩට ගැනීම ගැන විරුද්ධවීමේ බලය රජය වෙත තබා ගනු ලැබේ.

15. වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ලැයිස්තුවට තනි තනිව හෝ ලැයිස්තුවේ නම සඳහන් වෙන කෙනෙකුගේ නම ඇතුළත් වූ හෝ තමාට සැහේයයි පෙනීයන හේතුපිට කෘෂිකර්ම අධ්‍යක්ෂ තැන විරුද්ධවන හෝ කිසිවෙකු සමඟ කොන්ත්‍රාත්තුවකට බැඳෙනු නොලැබේ.

16. 1960-61 මුදල් වර්ෂය තුළදී ඉහත සඳහන් දේවලින් මුළු ප්‍රමාණය හෝ ඉන් කොටසක් සැපයීමට සති දෙකක් කල් දුන් විට එම කාලය තුළදී එකී දේවල් සැපයීමට ටෙන්ඩර්කරුවා බැඳිය යුතුයි.

17. වැඩි විස්තර සඳහා නුවරඑළියේ කෘෂිකර්ම කාර්යාලයේ දිස්ත්‍රික්ක කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරි තැනගෙන් විමසන්න. එසේ ලිවීමේදී රාජකාරි ලිපිනයට ලිවිය යුතුයි.

ඒ. වී. රිචර්ඩ්ස්,
කෘෂිකර්ම අධ්‍යක්ෂ.

1960 නොවැම්බර් 21 වැනි දින,
පේරාදෙණියේදීය.

10-767

---

## සුළු වාරිමාර්ග වැඩ

පහත සඳහන් සුළු වාරිමාර්ග වැඩ සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා සහකාර කොමසාරිස් තුමා විසින් 1960 නොවැම්බර් මස 15 වන අඟහරුවාදා අ. භා. 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. විවිධ සේවා සමිති ගොවි ද්‍රව්‍ය නිපදවීමේ සහ අලෙවි කිරීමේ සමිති සහ ග්‍රාම සංවර්ධන සමිති යන ආයතන වලින්ද ටෙන්ඩර් ඉදිරිපත් කළ හැකිය.

**හාපිටිගම් කෝරළය**

1. මඩබාවිට තාරදෙණිය ජලදොර තැනීම.
2. බලගල්ලේ කුඩාඔය සුඩ කිරීම.
3. දාසෙන්පව්වේ මහකුඹුර ජලදොර තැනීම.

**නැගෙනහිර සියනෑකෝරළේ**

1. පද්දාවල වෙදාගෙ අමුණ තැනීම.
2. මාඉඹුල ඇල හරහා ජලදොරක් තැනීම.

**උතුරු අළුත්කුරු කෝරළේ "බී" කොටස**

1. වීගොඩ ගොවි මණ්ඩල ප්‍රදේශයේ උනුමුව අමුන තැනීම.
2. මිනුවන්ගොඩ බෝගහවෙල දෙපා ඇල ජලදොරක් තැනීම.
3. පාලියටියන උනුහුමුව ජලදොර තැනීම.
4. මාතම්මන නො. 3 දරණ ජලදොර තැනීම.

**බටහිර සියනෑ කෝරළේ මැදපත්තුව**

1. හේනෙගම අළුබෝගහ කුඹුරේ ජලදොරක් තැනීම.
2. අරමංගොඩ මිල්ලගහ කුඹුරේ අමුණක් තැනීම.
3. තුම්මෝදර ජලදොරක් තැනීම.
4. දඩගමුව පත්ගමවැව ජලදොර තැනීම.
5. හිරිවලමුල්ල වැව අළුත්වැඩියා කිරීම සහ මැදවතුගොඩ සොරොව්වක් දැමීම.

**දකුණු අළුත්කුරු කෝරළේ**

1. හොරගොල්ලේ මැද වැටිය අමුනට ලැලි දැමීම සහ හොරගොල්ලේ (පල්ලෙවෙල) මහවෙල ඇලේ ජලදොරක් තැනීම.
2. නිවන්දම ගල්වාන අමුන තැනීම.

**හේවාගම් කෝරළය**

1. පනාගොඩ නැගෙනහිර කරුවලපිටිය නො. 1 ජලදොර තැනීම.
2. මලගල ගොවි මණ්ඩල ප්‍රදේශයේ ඇලවල් ශුඩ කිරීම.
3. බටහිර ඇරැව්වල මහඇල ශුඩ කිරීම.
4. අංගම්පිටියේ හල්අරඹ අමුණ තැනීම.
5. කොස්ගම පැලිය කුඹුරේ හියුම් පයිප්ප දමා පාලමක් තැනීම.

එක් එක් ටෙන්ඩර් පත්‍රිකාවක් සඳහා රු. 10ක් බැගින් කොළඹ දිස්ත්‍රික්කයේ දිසාපති තුමා සමග තැන්පත් කොට රිසිට් පත් ලබා ගත යුතුයි. ටෙන්ඩර් පෝර්ම කොළ 1960 නොවැම්බර් 14 වන දින අ. භා. 2.30 දක්වා මෙම කාර්යාලයෙන් ඉහත සඳහන් රිසිට් ඉදිරි පත් කොට ලබාගත හැක.

මේ සඳහා වැඩි විස්තර මෙම කාර්යාලයෙන් දැනගත හැකිය.

පී. ඇල්. ඩී. පී. සේනාරත්න,
සහකාර ගොවිජන සේවා කොමසාරිස්,
(කොළඹ දිස්ත්‍රික්කය)

1960.10.20 වෙනි දින
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,
නො. 283, ගාලුපාර, කොල්ලුපිටිය,
කොළඹ 3.

10—809

---

## ගොවිජන සේවා දෙපාර්තමේන්තුව

### මෙරට තල විකිණීම

පහත විස්තර සඳහන් 1959 අස්වැන්නෙන් ලබාගත් තල ටොන් පන්සියයක් (500) පමණ විකිණීම පිණිස තිබේ. ඒ සඳහා මිල ගණන් ගොවිජන සේවා කොමසාරිස් තැන විසින් වර්ෂ 1960ක්වූ නොවැම්බර් මස 11 වෙනි දින අ. භා. 3 වනතෙක් භාරගනු ලැබේ. මරදානේ නියමිත මිල යෝජනා ක්‍රම ගබඩාවේ (ත්‍රිපොලි වෙළඳ සැල ඉදිරිපිට) ප්‍රධාන භාරකරුගෙන් ඉල්ලුම් කළ විට මේ තල තොගය පරීක්ෂාකර බැලිය හැක.

2. විස්තර.—දුඹුරු සහ සුදු ඇට මිශ්‍ර ලංකාවේ කළු තලය. මේ තල ලංකාවේ විකිණීම සඳහා පමණක් දෙනු ලැබේ.

3. කවරයේ උඩ වම් කෙලවරේ "තල මිලදී ගැනීම සඳහා මිල ගණන්" යනුවෙන් සඳහන්කර කොළඹ 7හේ ඇඩින්බරෝ චන්ද්‍ර වංකයෙහි අංක 42 දරණ ස්ථානයෙහි ගොවිජන සේවා කොමසාරිස් තුමාගේ කාර්යාලයෙහි තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ හැක. නැතහොත් තැ. පෙ. අංක 537, කොළඹ 7 යන ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි.

4. ඉල්ලුම්කරුවන් විසින් තමන් ගැනීමට බලාපොරොත්තුවන ප්‍රමාණය ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කළ යුතුය.

5. වැඩි විස්තර තැ. පෙ. අංක 579, කොළඹ 10, ගොවිජන සේවා කොමසාරිස් තුමාගෙන් දැනගත හැක.

කේ. සිත්තම්බලම්,
ගොවිජන සේවා කොමසාරිස් තැන වෙනුවට.
(නියමිත මිල යෝජනා ක්‍රමය හා වී කෙටීම)

336, ඩීන්ස් පාර, කොළඹ. 10.
ගොවිජන සේවා දෙපාර්තමේන්තුව,

10-837

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### මෙරට සෑදූ හා පිට රටින් ගෙන්වූ කැලිකට් වර්ගයේ උළු සැපයීම

කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග හා විදුලි බල පිළිබඳ අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන (තැ. පෙ. 500, කොළඹ 1) මෙරට සෑදූ හා පිටරටින් ගෙන්වූ කැලිකට් වර්ගයේ වහල උළු ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවට සැපයීම සඳහා ටෙන්ඩර් 1960 නොවැම්බර් මස 22 වෙනි දින පෙරවරු 10 තෙක් භාරගනු ලැබේ. මේ උළු ලංකා සම්මති මණ්ඩලයේ 1957 අංක 4 දරණ විශෙෂ විස්තරයට අනුකූලවූ ඒවා විය යුතුයි.

2. කොළඹ ගාලු මුවදොර එව්ලන් චතුරශ්‍රයෙහි ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගෙන් 1960 නොවැම්බර් මස 18 වෙනි සිකුරාදා දවල් 12 තෙක් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මයක අනු පිටපතකුත් සමඟ ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුයි. ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට මත්තෙන් ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ හෝ ලංකා බැංකුවේ කොළඹ ශාඛාවේ ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ තැනගේ අංක 1 ක දරණ ගණනයට හෝ කොළඹින් බැහැර කච්චේරියක රු. 100 ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ යුතුයි.

3. කොළඹ ගාලු මුවදොර මහා ලේකම් කාර්යාලයේ අංක 355 දරණ කාමරයේදී 1960 නොවැම්බර් මස 22 වෙනි දින (අඟහරුවාදා) පස්වරු 2.30 ට ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. කැමති ටෙන්ඩර් කරුවන්ට විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටිය හැක.

4. පහත දැක්වෙන උළු ප්‍රමාණයන් අවශ්‍ය වේ. මේ ප්‍රමාණවල් අස්ථිරය.

5. 4,000,000 පැතලි උළු හා 133,000 ක් මුදුන් උළු.

මේ උළු පහත සඳහන් ඉඩම් සංවර්ධන නිලධාරීන්ගේ ව්‍යාපාරයන් සඳහා වේ :—

| | | පැතලි උළු | මුදුන් උළු |
|---|---|---|---|
| ඉඩම් සංවර්ධන නිලධාරි— | අනුරාධපුර | 570,000 | 19,000 |
| | දඹුල්ල | 156,000 | 5,000 |
| | ඇඹිලිපිටිය | 483,000 | 17,000 |
| | ගාල්ල | 849,000 | 19,000 |
| | නුවර | 718,000 | 24,000 |
| | මාන්කුලම | 234,000 | 8,000 |
| | පදවිය | 644,000 | 24,000 |
| | ප්‍රධාන කාර්යාලය | 364,000 | 14,000 |

6. වැඩි විස්තර සඳහා ඉඩම් සවංර්ධන අධ්‍යක්ෂ ගෙන් විමසන්න.

ඉඩම් සංවර්ධන අධ්‍යක්ෂ.

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව,
එච්ලන් චතුරශ්‍රය,
කොළඹ 1,
1960 ඔක්තෝබර් මස 15 දින දීය.

10-661

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### පිටපලු විකිණීම

ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ පදවියේ ලී මෝලේ ඇති ඝන යාර 3,000ක් පමණ පිටපලු මිළට ගැනීම සහ ගෙනයාම සඳහා පදවියේ ඉඩම් සංවර්ධන නිලධාරිතැන විසින් 1960 නොවැම්බර් මස 18 වෙනි දින සවස 2.30 වනතෙක් ටෙන්ඩර් බාරගනු ලැබේ.

පිටපලු සම්පූර්ණ තොගයටම හෝ ඉන් කොටසකට හෝ ටෙන්ඩර් බාරගන්නා අතර එසේ මිළට ගනු ලබන පිටපලු සති දෙකක් ඇතුළතදී ගෙනයා යුතුය. ටෙන්ඩර් පත් එවනවිට පිටපත් දෙකක් එවිය යුතුයි.

ටෙන්ඩර් පත් පදවියේ ඉඩම් සංවර්ධන කාර්යාලයේ ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීම හෝ ලියා පදිංචිකළ තැපැලෙන් එවීම හෝ කළ හැකිය. ටෙන්ඩර් පත් සුරක්ෂිත කවරයක බහා එහි වම්පස උඩ කෙළවරෙහි “ පිටපලු මිළට ගැනීම සඳහා ටෙන්ඩර් ” යනුවෙන් සඳහන් කළ යුතුයි.

මේ පිළිබඳ වැඩි විස්තර පදවියේ ඉඩම් සංවර්ධන නිලධාරිතැනගෙන් ලබාගත හැක.

ජී. ඩබ්ලිව්. ඇම්. පෙරේරා,
ඉඩම් සංවර්ධන නිලධාරි තැන, පදවිය.

ඉඩම් සංවර්ධන කාර්යාලය,
පදවිය හන්දිය.
1960.10.24,

18—816

## ධීවර අධිකාරිය

### ගැලුම් එකේ හිස් පින් සැපයීම

1960 නොවැම්බර් මස 11 වෙනි සිකුරාදා පූ. භා. 10.30 දක්වා කොළඹ, ගාලුමුවදොර, ධීවර අධිකාරියේ ධීවර අධිකාරි තැන විසින් ගැලුම් එකේ හිස් පින් සැපයීම සඳහා ටෙන්ඩර් භාර ගන්නවා ඇත.

2. ඔහුගෙන් ලබා ගන්නා ඉල්ලුම් පත්‍රවල මිළ ගණන් ඉදිරිපත් කළ යුතුයි. මේ ගැන වැඩි විස්තර ඔහුගෙන් ලබා ගත හැක.

3. ඉල්ලුම් පත්‍ර ලබා ගන්නට පෙර තැන්පත් කළ යුතු මුදල රුපියල් 25 යි.

ඩී. ටී. ජී. ඒ. ද පොන්සේකා,
ධීවර අධිකාරි තැන.

ධීවර අධිකාරිය,
ගාලුමුවදොර, කොළඹ,
ඔක්තෝම්බර් 20, 1960.

10-713

## කොළඹ වරාය කොමිෂන් සභාව

කොළඹ වරාය කොමිෂන් සභාවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් 1960 නොවැම්බර් මස 17 වෙනි බ්‍රහස්පතින්දා පස්වරු 2.30 දක්වා කොළඹ වරාය කොමිෂන් සභාවට වොට්ස් 500 විදුලි ලාම්පු 200ක් සහ වොට්ස් 100 විදුලි ලාම්පු 1,500ක් සපයා භාරදීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ. 1960 නොවැම්බර් මස 17 වෙනි දින පස්වරු 2.30ට ටෙන්ඩර් පත්‍ර විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට එහි පෙනී සිටින්ට අවසර දෙනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර රිජිස්ටර් තැපැලෙන් නොඑවන අය විසින් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තුමා විසින් ටෙන්ඩර් භාර ගැනීම සඳහා බලය පවරන ලද නිලධාරියාට ටෙන්ඩර් පත්‍ර පුද්ගලිකව භාර දී ඒ පිළිබඳව එම නිලධාරියාගෙන් කුවිතාන්සියක් ලබා ගත යුතුය.

3. ටෙන්ඩර් පිළිබඳ ලිපි ලේඛන කොළඹ වරාය කොමිෂන් කාර්යාලයේදී පරීක්ෂා කළ හැක. රු. 25 මුදලක් වරාය කොමිෂන් කාර්යාලයේ තැන්පත් කර ඒ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට ටෙන්ඩර් ෆෝර්ම කොළ ලබා ගත හැක. ටෙන්ඩර් කොන්දේසි වලට අනුව ඇප මුදල ආපසු ගෙවනු ලැබේ.

4. ඉහත සඳහන් අන්දමට ලබා ගත් ෆෝර්ම කොළවල ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. 1960 නොවැම්බර් මස 16 වෙනි බදාදා දවල් 12 දක්වා ටෙන්ඩර් ෆෝර්ම කොළ නිකුත් කරනු ලැබේ.

ඒ. ඇස්. කොහොඹන්වික්‍රම,
වරායේ කොමසාරිස්.

1960 ඔක්තෝබර් මස 20 වෙනි දින,
කොළඹ, වරාය කොමිෂන් කාර්යාලයේදීය.

10-684

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### ජාතික කිරි ව්‍යාපාරය—පිරිසිදු එළකිරි එහා මෙහා ගෙනයාම

**1. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයන් හා සේවා.**—වර්ෂ 1960 දෙසැම්බර් මස 1 වෙනිදා සිට 1961 සැප්තැම්බර් මස 30 වෙනිදා දක්වා (දෙදින ඇතුළුව) කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට, සෞඛ්‍ය කාර්යාලවල සිට කිරි මධ්‍යස්ථානවලට පිරිසිදු එළකිරි ගෙනයාම සඳහා ලාංකිකයන්ගෙන් සහ ලාංකික වෙළඳ සමාගම් විසින් එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර්පත්‍ර, කොළඹ, ගාලු මුවදොර, මහලේකම් කාර්යාලය යාබද “බී” අක්ෂරය දරණ ගොඩනැගිල්ලේ පිහිටි, සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ මුදල් අංශයේදී සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ තැන විසින් භාර ගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛන යෙහි දෙවන ඡේදයෙහි සඳහන් පරිදි, රු. 100ක තැන්පත් මුදලක්, මා නමට කොළඹ හැර අනිකුත් කච්චේරියක හෝ කොළඹ බ්‍රිස්ටල් වීදියේ ඇති ලංකා බැංකුවේ හෝ තැන්පත් කොට කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

සැ. යු.—කොළඹ ලංකා බැංකුවේ මුදල් තැන්පත් කිරීම සඳහා වුව මනා ෆෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

(ii) **ටෙන්ඩර්පත්‍ර.**—ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වන තුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන තැන්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් හෝ ලබාගත හැක. නියමිත ෆෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක් වත් භාරගනු නො ලැබේ. ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට ගන්නා ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍ර යට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් ෆෝර්ම ලබා ගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි ෆෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත්‍ර වේලාස නින් එවිය යුතුයි.

**3. වත්කමේ විස්තර.**—මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත් තුවක් නො දරණ අය ටෙන්ඩර් ෆෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ සැලකිය යුතු කාලයකට පළමු තම වත්කම, මට හෝ තමා ටෙන්ඩර් ෆෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධි කාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා ෆෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නො හැකිවීම හෝ මුදල් තත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමිවන්නට ඉඩ තිබේ.

**4. ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැන ගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 3 වැනි තීරය බලන්න.

**5. ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියළුම ටෙන්ඩර්පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා “ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ, “ බී ” අක්ෂරය දරණ ගොඩනැගිල්ල, මුදල් අංශය, මහලේකම් කාර්යාලයය, ගාලු මුව

25 වෙනි සිකුරාදා පස්වරු 2.30 දක්වා භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී ටෙන්ඩර්කරුවනට එහි පැමිණිය හැක.

කොළඹ මැක්ලම් පාරේ පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුවේ මාර්ග හා වැඩ පිළිබඳ අංශයේ ප්‍රධාන ඉංජිනේරු තැනගෙන් (තැ. පෙ. අංක 370) මේ සඳහා පෝර්ම කොළ ලබාගෙන, ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සමග එවිය යුතුයි. මේ සම්බන්ධයෙන් සියලු විස්තර මෙම නිලධාරිතැන ගෙන් ලබාගත හැක. සැලැස්මවල් ද ඔහුගේ කායභාලයේදී බලාගැනීමට පුළුවන.

වෂී 1960 නොවැම්බර් මස 11 වෙනි සිකුරාදා පස්වරු 4 දක්වා, ටෙන්ඩරය සඳහා තැන්පත් කළයුතු මුදල වන රු. 50 හා ටෙන්ඩර් ගාස්තු වශයෙන් රුපියල් 10 ක් ද තැන්පත්කර ලබාගත් කුවිතාන්සි ඉදිරිපත් කළවිට, ටෙන්ඩර් පෝර්ම ලබාගත හැක.

මෙම මුදල් තැන්පත් කළ යුත්තේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ගණකාධිකාරීගේ කායභාලයේදීය.

ටෙන්ඩර් පත්‍ර කවරයක බහා, මුද්‍රා තබා එහි වම් පස උඩ කෙළවරෙහි "බණ්ඩාරවෙල දුම්රියපල අසළ අඟල් 9—15 කළුගල් කියුබ් 800 ක් සැපයීම සඳහා ටෙන්ඩර් පත්‍ර" යන්න සඳහන්කර, ලියා පදිංචිකළ තැපෑලෙන් 1960 නොවැම්බර් මස 25 වෙනි සිකුරාද පස්වරු 2.30 ට පෙර ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ඉංජිනේරු කායභාලීය "ටෙන්ඩර් බෝඩ්" මණ්ඩලයේ සභාපතිතැන වෙත ලැබෙනසේ එවිය යුතුයි. ස්වකීය ටෙන්ඩර් පත්‍රය තැපැල් මගින් එවීමට අකමැතිනම් එය ඉහත සඳහන් කායභාලයේ ටෙන්ඩර් පත්‍ර භාරගැනීමට බලය ලත් නිලධාරියෙකුට නියමිත වේලාවට පෙර භාරදී කුවිතාන්සියක් ලබා ගත යුතුයි.

එන්. ඒ. වෛත්‍යලිංගම්,
ප්‍රධාන ඉංජිනේරු තැන.

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව,
තැ. පෙ. අංක 370,
කොළඹ, 1960.10.22.

10-827.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**මන්නාරම, එරුක්කලම්පිඩ්ඩි 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 10ක් තැනීම**

මන්නාරම, එරුක්කලම්පිඩ්ඩි 1 ඩබ්ලිව් වර්ගයේ ගෙවල් 10 ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 දෙසැම්බර් මස 2 වෙනි සිකුරාද පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මාණක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 50,000 කට හෝ ඊට වැඩි ගණනකට ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත් කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 50 ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 නොවැම්බර් මස 30 වෙනි බදාද දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ධම්සේන ජයනෙත්ති,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1960 ඔක්තෝබර් මස 18 වෙනි දින.

10-653

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**බදුල්ල, මහලියද්ද 1ඩබ්ලිව්. ඒ වර්ගයේ ගෙවල් 3ක් තැනීම**

බදුල්ල, මහලියද්ද 1ඩබ්ලිව්. ඒ වර්ගයේ ගෙවල් 3ක් තැනීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 නොවැම්බර් මස 25 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් බාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර් කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිඩ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් (10,000කට හෝ ඊට වැඩි ගණනකට) ලියාපදිංචි කරනලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 25ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 නොවැම්බර් මස 23 වෙනි බදාද දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ධම්සේන ජයනෙත්ති,
ජාතික නිවාස කොමසාරිස් තැන.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො. 544,
කොළඹ 2,
1960 ඔක්තෝබර් මස 21 වෙනි දින.

10-776.

---

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

**බත්තරමුල්ල, මිනුවන්විල වතුයායේ ජලසම්පාදන ක්‍රමයෙහි ඉතිරි වැඩ කිරීම**

බත්තරමුල්ල මිනුවන්විල වතුයායේ ජලසම්පාදන ක්‍රමයෙහි ඉතිරි වැඩ කිරීම සඳහා ජාතික නිවාස ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1960 දෙසැම්බර් මස 2 වෙනි සිකුරාදා පෙරවරු 10 වන තුරු ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර එදින එකී වේලාවට විවෘත කරන විට ටෙන්ඩර්කරුවන්ට පැමිණ සිටිය හැක.

පිටපත් දෙකකින් යුත් ටෙන්ඩර් පත්‍ර මෙම දෙපාර්තමේන්තුවේ නිර්මානක ඉංජිනේරු තැනගෙන් ලබාගත හැකිවා මෙන්ම වැඩි විස්තරද ඔහුගෙන් ලබාගත හැක.

ප්‍රසිද්ධ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි කර්මාන්ත වැඩ සඳහා රුපියල් 20,000කට හෝ ඊට වැඩි ගණනකට ලියාපදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවෝ පමණක් ටෙන්ඩර් පත්‍ර ඉදිරිපත් කිරීමට සුදුස්සෝ වෙති. එම ලියාපදිංචි කරන ලද සහතිකය සහ මෙම දෙපාර්තමේන්තුවේ සරප් තැන වෙත රුපියල් 25ක තැන්පත් මුදලක් තැබූ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කරන අයවලුන්ට 1960 නොවැම්බර් මස 30 වෙනි බදාදා දවල් 12 වන තුරු ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

ධර්මසේන ජයනෙත්ති,
ජාතික නිවාස කොමසාරිස් තැන.

1960 ඔක්තෝබර් මස 21 වැනි දින,
ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
තැපැල් පෙට්ටිය නො, 544,
කොළඹ 2.

10-777.

---

## ලංකා ගමනාගමන මණ්ඩලය

පයින් ලෑලි (බෝඩ්) සැපයීම සඳහා එවන ටෙන්ඩර පත්‍ර කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ටෙන්ඩර මණ්ඩලයේ සභාපති මහතා විසින් 1960 දෙසැම්බර් මස 28 වෙනි බදාදා පෙ. ව. 10 වන තෙක් බාරගනු ලැබේ.

ටෙන්ඩර පත්‍ර නියමිත පෝරම කොළවල ලියා අනුපිටපතකින්ද යුක්ත කොට එවිය යුතුයි. ඒ පෝරම කොළ බොරලැස්ගමුවේ වේර හැර පිහිටි ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන සම්පාදක කායභාල යෙන් 1960වේ දෙසැම්බර් මස 27 වෙනි අඟහරුවාදා දවල් 12 වන තුරු ලබාගත හැකිය. ඒවා දෙන්නේ කොළඹ 5 කිරුළ පාරේ 200 වෙනි ස්ථානයෙහි වූ ලංකා ගමනාගමන මණ්ඩලීය ප්‍රධාන ගිණුම් නිලධාරි කායභාලයෙහි රු. 100ක ටෙන්ඩර මුදලක් තැන්පත් කොට ඊට ලැබුණ කුවිතාන්සිය ඉදිරිපත් කළ විටය.

ප්‍රධාන සම්පාදක නිලධාරි කායභාලයෙන් වැඩි විස්තර දැනගත හැකිය.

සී. අයි. ඇඩ්වඩ්ස්,
ලංකා ගමනාගමන මණ්ඩලයේ වැඩබලන ලේකම්තැන.

1960. 10. 28.

10-815.

---

කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ වඩු පාසැල්වලට ලී සැපයීම සඳහා සීල් ටැන්ඩර් 1960.11.5 වෙනි දින පෙරවරු 10 දක්වා ම විසින් භාරගනු ලැබේ. අනුමත කරන ලද ලී වර්ග නම් :—කොස්, හල්මිල්ල, බුරුත, හුලංහික් සහ වැවරණ වෙත්.

මෙම දිස්ත්‍රික්කයේ ඇති යාන්ත්‍රික වඩු පාසැල් 2ට සහ යාන්ත්‍රික නොවන වඩු පාසැල් 3ට තුන් මසකට අවශ්‍ය ලී ප්‍රමාණයන් පහත දැක්වේ.

### යාන්ත්‍රික පාසැලකට

1. ½″ ඝන, 6′–12′ දක්වා දික් සහ 6″–12″ පලල ලෑලි හ.අ. 750 යි.
2. ¾″ ඝන, 6′–12′ දක්වා දික් සහ 6″–12″ පලල ලෑලි හ.අ. 300 යි.
3. 1″ ඝන, 6′–12′ දක්වා දික් සහ 6″–12″ පලල ලෑලි හ.අ. 3,000 යි.
4. 1½″ ඝන, 6′–12′ දක්වා දික් සහ 6″–12″ පලල ලෑලි හ.අ. 150 යි.
5. 4″×2″, 6′–12′ දක්වා දික් ලී දි.අ. 1,500 යි.
6. 3″×3″, 6′–12′ දක්වා දික් ලී, දි.අ. 100 යි.

### යාන්ත්‍රික නොවන පාසැලකට

1. ½″ ඝන, 6′–12′ දක්වා දික් සහ 6″–12″ පලල ලෑලි හ.අ. 375 යි.
2. ¾″ ඝන, 6′–12′ දක්වා දික් සහ 6″–12″ පලල ලෑලි හ.අ. 150 යි.
3. 1″ ඝන, 6′–12′ දක්වා දික් සහ 6″–12″ පලල ලෑලි හ.අ. 1,500 යි.
4. 1½″ ඝන, 6′–12′ දක්වා දික් සහ 6″–12″ පලල ලෑලි හ.අ. 75 යි.
5. 4″×2″, 6′–12′ දක්වා දික් ලී දික් අඩි 750 යි.
6. 3″×3″, 6′–12′ දක්වා දික් ලී, දික් අඩි 50 යි.

ඉහත සඳහන් ලීවලට මිල සඳහන් කරන විට ගමන් ගාස්තු සහිතව මිල සඳහන් කළ යුතුයි. පාඨශාලාවල ලිපිනය පහත සඳහන් වේ:—

1. රජයේ යාන්ත්‍රික වඩු පාසැල, මල්කඩුවාව, කුරුණෑගල.
2. රජයේ යාන්ත්‍රික වඩු පාසැල, කුලියාපිටිය.
3. ජනලිය රජයේ වඩු පාසැල, පොල්ගහවෙල.
4. බුජ්ජමුව රජයේ වඩු පාසැල, නවතල්වත්ත.
5. කිරාවැව රජයේ වඩු පාසැල, ඉලුක්හේන.

එක පාසැලකට ලොරි ලෝඩ් 1ක බැගින් ලොරි ලෝඩ් 3ක් මාස තුනට සැපයිය යුතුය. ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයට එවන විට උඩ වම් කෙළවරෙහි " ග්‍රාම සංවර්ධන හා ගෘ. .ක. අංශයට ලී සැපයීම " යන්න සඳහන් කළ යුතුයි.

ටෙන්ඩර් පත්‍ර ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

මේ සම්බන්ධයෙන් ලී වල වටිනාකමින් සියයට 5ක මුදලක් තැන්පත් කළ යුතුයි. කලට වේලාවට ලී සැපයීමට නොහැකි වී නම් කොන්ත්‍රාත්තුව අවලංගු කිරීමට සිදු වේ.

තවද එක් එක් ලී වර්ගයකට වෙන් වෙන් වශයෙන් මිල ගණන් සඳහන් කළ යුතුයි.

සුගතදස ජයවික්‍රම,
කුරුණෑගල දි. දිසාපති වෙනුවට.

ග්‍රා.ස. හා ගෘ.ක. අංශය,
කච්චේරිය, කුරුණෑගල.
1960.11.22.

10–855

---

## බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ කොට්ඨාශයේ හැගොඩ අන්දෙනිය ජනපදයට නල මගින් ජලය සැපයීම

බදුල්ල දිස්ත්‍රික්කයේ යටිකිඳ කොට්ඨාශයේ හැගොඩ අන්දෙනිය ජනපදයට නල මගින් ජලය සැපයීම සඳහා ලියාපදිංචිකළ කොන්ත්‍රාත් කරුවන්ගෙන් 1960වේ නොවැම්බර් 25 වෙනි සිකුරාද පස්වරු 2.30ට කොළඹ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ ප්‍රධානතැන විසින් 'සීල්' තබන ලද ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටෙන්ඩර් පත්‍ර භාරගැනීම හෝ ප්‍රතික්ෂෙප කිරීම ටෙන්ඩර් මණ්ඩලයේ ප්‍රධාන තැන සතුය.

3. 1960 නොවැම්බර් 18 වෙනි දින සවස 3 වනතුරු බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපතිතැනගෙන් ටෙන්ඩර් පත්‍ර සහ ඒ පිළිබඳ විස්තර දැන ගත හැක.

බී. පී. වී. ඒ. ජේ. පී. සේනාරත්න,
බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපතිතැන.

1960.10.20 වෙනි දින,
බදුල්ල කච්චේරියේ දීය.

### විස්තර වාර්තාව

1. ටෙන්ඩර් පත්‍ර අනුපිටපතක් සහිතව කොළඹ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ ප්‍රධාන තැන වෙත ලැබෙන පිණිස එවිය යුතුය.

2. සියළුම ටෙන්ඩර් පත්‍ර ඒවා බහාලූ කවරයේ මුදුන් වම් කෙළවරේ "හැගොඩ අන්දෙනිය ජනපදයට නල මගින් ජලය සැපයීම පිළිබඳ ටෙන්ඩරයයි" යන්න සහ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනයද, සඳහන්කොට, ටෙන්ඩර් මණ්ඩලයේ ප්‍රධාන තැන වෙත 1960 නොවැම්බර් 25 වෙනි සිකුරාද සවස 2.30 ට පෙර ලැබෙන සේ එවිය යුතුයි.

ටෙන්ඩර් පත්‍ර කොළඹ, ගාලු මුවදොර, මහලේකම් කාර්‍යාලයේ 3 වෙනි තට්ටුවේ අංක 320 දරණ කාමරයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටිය තුළ තැන්පත් කළ යුතුය. නැතහොත් ඒවා ලියාපදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි.

3. 1960 නොවැම්බර් 25 වෙනි සිකුරාද සවස 2.30 ට කොළඹ ගාලු මුවදොර මහා ලේකම් කාර්‍යාලයේ 3 වෙනි තට්ටුවේ අංක 320 දරණ කාමරයේ දී ටෙන්ඩර් පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්කරුවන්ට උවමනා නම්, ටෙන්ඩර් පත්‍ර විවෘත කරන වේලාවේදී එහි පැමිණ සිටිය හැක.

4. ටෙන්ඩර් එවිය යුත්තේ බදුල්ල කච්චේරියෙන් ඉල්ලුම්කර ලබාගත් පත්‍රිකාවලය. නියමිත පත්‍රිකාවේ ලියා නැති ටෙන්ඩරයක්, ටෙන්ඩර් පත්‍රයක් ලෙස සලකනු නොලැබේ. එක් එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රු. 50ක මුදලක් ඕනෑම කච්චේරියක තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1960.11.18 වෙනි දින සවස 3 දක්වා ටෙන්ඩර් පත්‍ර බදුල්ල කච්චේරියෙන් ලබාගත හැක.

5. සියලුම ටෙන්ඩර්වල වෙනස් කිරීම් සහ මැකීම් වෙනුවෙන් ටෙන්ඩර්කරුවන්ගේ කෙටි අත්සන තැබිය යුතුය. ටෙන්ඩරයේ මුලු මුදල, වචනයෙන්ද සඳහන් කළ යුතුය. ටෙන්ඩරයේ වචනයෙන් සඳහන් කරනලද මුළු මුදල එහි ඉලක්කම්වලින් සඳහන් කරන ලද්දට වෙනස්ව ඇතිනම් හෝ එහි මුළු මුදල වචනයෙන් පමණක් සඳහන් කර ඇති නම් ඒ වචනවලින් සඳහන් කරන ලද ගණන පමණක් භාරගනු ලැබේ. ටෙන්ඩර් පත්‍රවල වැරදි හෝ ගණන් පිළිබඳ වෙනසක් ඇති වුවහොත් එවැනි ටෙන්ඩර් පත්‍ර භාරගනු ලබන්නේ ශුද්ධ කිරීමේ තීරණය උඩය.

6. කිසියම් ටෙන්ඩරයක් භාරගත් බවට කිසියම් ටෙන්ඩර්කරුවෙකු වෙත ලියවිල්ලක් ලැබී දිනක් ඇතුළතදී පිළිගත් ඇප මුදල සම්පූර්ණ වශයෙන් තැන්පත් කර පොරොන්දු පත්‍රයකට අත්සන් කිරීමට ඔහුට නොහැකි වුවහොත් ඔහු විසින් තැන්පත් කරනලද ටෙන්ඩර් මුදල රාජසන්තක වනු ඇත. ටෙන්ඩරය භාරගත් බව දැක්වෙන දැන්වීම් සාර්ථක ටෙන්ඩර්කරු විසින් සපයන ලද ලිපිනයට ලියාපදිංචිකළ තැපැලෙන් යැව් විට හෝ එතැනට භාරදුන් විට හෝ එකී සාර්ථක ටෙන්ඩර්කරු වෙත එය ලැබුණු බව පිළිගනු ලැබේ.

7. තමන් භාරගත් වෙනත් කොන්ත්‍රාත් වැඩ අතෙහි ඇති, ටෙන්ඩර් ඉල්ලුම් කිරීමට අදහස් කරන කොන්ත්‍රාත්කරුවන් එකී වැඩ පිළිබඳ සතුටුදායක දියුණු තත්ත්වය දැක්වෙන පරිපාලක සහතිකත් ටෙන්ඩර් පිළිබඳ කරන ලද තැන්පත් මුදල වෙනුවෙන් ලද කුවිතාන්සියත් සමග කාලවේලා ඇතිව බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපතිතැන වෙත එවිය යුතුයි.

8. භාර ගන්නා ලද ටෙන්ඩරයක් වෙනුවෙන් ඇපකරුවන් අවශ්‍ය වුවහොත් එකී ටෙන්ඩර්කරුට එය ඉටුකිරීමට හැකි විය යුතුයි.

9. ටෙන්ඩරයේ සඳහන් මුළු මුදලින් සියයට පහක ඇප මුදලක් එහි සඳහන් වැඩ හරියාකාර කිරීමේ පොරොන්දුවක් වශයෙන් තෝරා පත්කරගනු ලැබූ අයදුම්කරු විසින් තැන්පත් කරමින් එකී වැඩ හරියාකාර කරන බවට ප්‍රමාණවත් ඇපකරුවන් ලවා පොරොන්දු පත්‍රයක් සහතික කළ යුතුයි.

10. ඉහත සඳහන් කොන්දේසි නිසි ලෙස ඉටු නොකළොත් ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

11. කිසියම් ටෙන්ඩර් පත්‍රයක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමටද, ටෙන්ඩර් පත්‍රයක කිසියම් කොටසක් පිළිගැනීමටද, බලය, ප්‍රශ්න රහිතව රජය විසින් තබාගනු ලැබේ.

12. ටෙන්ඩර් මණ්ඩලයේ අනුමතිය නැතිව කිසිම කොන්ත්‍රාත්තුවක් කෙනෙකු වෙත පැවරීමට හෝ කෙනෙකුට භාර කිරීමට හෝ කොන්ත්‍රාත් කරුට නොහැක. කොන්ත්‍රාත්කරු විසින් තමා වෙනුවට පෙනීසිට කොන්ත්‍රාත්තුව කරගෙන යාමට අන් අයෙකු වෙත පවරන ලද ඇටර්නි බලය භාර ගැනීමේ හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය විසින් තබා ගනු ලැබේ.

13. කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි යොදවනු ලැබූ අයෙකු වෙනුවෙන් බදුල්ල දිස්ත්‍රික්කයේ දිසාපති තැනට ඒත්තුගත යුතු හේතුන් උඩ ඔහුගේ සේවය නුවුමනා බව පිළිගැනුනවිට ඒ පිළිබඳ විරුද්ධත්වයට ලියවිල්ලකින් කොන්ත්‍රාත්කරු වෙත ඉදිරිපත් කරනු ලැබේ. එවිට එවැනි අය කොන්ත්‍රාත්කරු විසින් වැඩෙහි නොයෙදිවිය යුතුයි.

14. දිස්ත්‍රික්කයෙන් මෙම දෙපාර්තමේන්තුවේ කොන්ත්‍රාත් වැඩ කළ අයදුම්කරුවෙක් වෙතොත් එවැනි වැඩ කරන ලද්දේ කිනම් දිස්ත්‍රික්කයද යන්න සඳහන් කළ යුතුය.

15. රජයේ වෙන යම් දෙපාර්තමේන්තුවක කොන්ත්‍රාත් වැඩ කරන ලද අයදුම්කරුවෙක් වෙතොත් ඒ දෙපාර්තමේන්තුවේ නම සහ ඒ වැඩ පිළිබඳව විස්තරයක් ද ඒවා කරන්නට යෙදුන දිස්ත්‍රික්කයද සඳහන් කළ යුතුයි.

16. වැඩ පැහැර හරින ලද කොන්ත්‍රාත්කරුවන් පිළිබඳ ආණ්ඩුවේ ලැයිස්තුවේ නම් සඳහන් කොන්ත්‍රාත්කරුවන්ගෙන් ටෙන්ඩර් පත්‍ර භාරගනු නොලැබේ.

17. තෝරා කර ගන්නා ලද ටෙන්ඩර්කරු විසින් බදුලු දිස්ත්‍රික්කයේ දිසාපති තැන සමග හෝ මහා භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම් තැන සමග හෝ කොන්ත්‍රාත්තුවකට බැඳිය යුතුයි.

මෙම කොන්ත්‍රාත්තුවට ඉහත සඳහන් නිලධාරීන් මෙන්ම ඔවුන්ගෙන් පසු මෙම නිලය දරන්නවුන් ද ඇතුළත් වේ.

18. තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු විසින් අත්සන් කරනු ලබන පොරොන්දු පත්‍රයෙහි දැක්වෙන පහත සඳහන් කොන්දේසි වලට එකඟවිය යුතුයි.

(1) ලාංකික කම්කරුවන් පමණක් වැඩට යෙදවිය යුතුයි. (ලාංකික යන්නේ තේරුම නම් පරම් පරාවෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් ලංකාවේ පුරවැසියෙක්වූ තැනැත්තන් ය යන්නයි).

(2) කම්කරු වන්දි ආඥාපනත යටතේ පැන නැගෙන වන්දි ඉල්ලීම් පිළිබඳව කොන්ත්‍රාත්කරු විසින් ආණ්ඩුව නිදහස් කළ යුතුයි.

(3) ලංකාණ්ඩුවේ අණපනත් හැකිතාක් දුරට මේ වෙනුවෙන් බල පවත්වනු ලැබේ.

19. පොරොන්දු පත්‍රයට ඇලවිය යුතු මුද්දරවල වටිනාකම තෝරා ගනු ලැබූ ටෙන්ඩර්කරු විසින් ගෙවිය යුතුයි.

10-810

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

පේරාදෙනියේ ලංකා විශ්ව විද්‍යාල යෝජනා ක්‍රමයේ "ඔගස්තා හිල්"හි ලඟාවීමේ මාගී ජල සේවා සහ කාණු ඇතුළුව මාණ්ඩලික නිවාස 6ක් තැනීම හා භූමි භාගය සමතලා කිරීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණ සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 නොවැම්බර් මස 23 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. පේරාදෙනි විශ්ව විද්‍යාල යෝජනා ක්‍රමයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන නිර්මාණ ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 නොවැම්බර් මස 11 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි, ජල සේවා සහ කාණු ක්‍රම වැඩ සඳහා රුපියල් 3,00,000ට නොඅඩු ගණනකට ලියාපදිංචිවූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 250ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති; සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාතීමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

1960.10.24,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය.

10-832/1

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

අනුරාධපුර මහලු මඩමේ කණිෂ්ඨ සේවකයින් සඳහා 1 ඒ ශ්‍රේණියේ නිවාස 3ක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 නොවැම්බර් මස 23 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30 ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුරයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 නොවැම්බර් මස 11 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 60,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති; සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායභාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

1960.10.24,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය.

10-832/2

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

අනුරාධපුර මහලු මඩමේ නිලධාරීන් සඳහා ජල මුද්‍රා වැසිකිළි 3ක් සහ 3 බී ශ්‍රේණියේ නිවාස දෙකක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ 1, ට්‍රාන්ස්වර්ක්ස් හවුස්හි පිහිටි ප්‍රවාහණය සහ රජයේ වැඩ පිළිබඳ අමාත්‍යාංශයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 නොවැම්බර් මස 23 වෙනි බදාදා පෙරවරු 11 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීමට නියමිත වේලාව වන මෙදින පස්වරු 2.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. අනුරාධපුරයේ ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරු තැනගෙන් පෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධව සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබාගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේදී බලා ගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 නොවැම්බර් මස 11 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 57,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරු තැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 100ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කෝපරේෂන් ".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති; සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

1960. 10. 24,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය.

10-832/3

---

## ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුව

කළුතර මහාරෝගයශාලාවේ ඇපොතිකරිවරුන් සඳහා විවේක කාමරයක් සහ බෙහෙත් ද්‍රව්‍ය සඳහා ගබඩාකාමර දෙකක් තැනීම සඳහා එවන ටෙන්ඩර් පත්‍ර කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයෙහි වූ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් වර්ෂ 1960 නොවැම්බර් මස 23 වෙනි බදාදා පෙරවරු 10.30 වන තෙක් භාර ගනු ලැබේ. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන එකී වේලාවේදී බදාදා පෙරවරු 10.30ට ටෙන්ඩර්කරුවන්ට එතැනට පැමිණ සිටිය හැකිය.

2. කළුතර ආ. වැ. දෙපාර්තමේන්තුවේ විධායක ඉංජිනේරුතැනගෙන් පෝරම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක් ද සහිතව එවිය යුතුයි. මේ සම්බන්ධ සියලු විස්තර හා තොරතුරු ඔහුගෙන් ලබා ගත හැකිය. සැලැස්මවල් ද ඔහුගේ කාර්යාලයේ දී බලාගැනීමට පුළුවන.

3. වර්ෂ 1960 නොවැම්බර් මස 11 වෙනි සිකුරාදා පස්වරු 4.30 වන තෙක් ආ. වැ. දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා රුපියල් 23,000ට නොඅඩු ගණනකට ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට පමණක් ඉහත සඳහන් ඉංජිනේරුතැනට (අ) තමන්ගේ ලියාපදිංචිය පිළිබඳ ලියකියවිලි සහ (ආ) ටෙන්ඩර් තැන්පත් මුදල වන රු. 25ක් තැන්පත් කර ලබාගත් කුවිතාන්සිය ඉදිරිපත් කළ විට මේ සඳහා ටෙන්ඩර් පත්‍ර එවිය හැකිය.

4. පහත සඳහන් ආයතන හා සමිතිවලින් ටෙන්ඩර් තැන්පත් මුදල් අවශ්‍ය නැත :—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය ;

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන ; නිදසුනක් : "චෛනා නැෂනල් මැෂිනරි, ඉම්පෝට් කෝපරේෂන්".

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති ; සහ

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

5. ටෙන්ඩර් සඳහා තැන්පත් කළ යුතු මුදල කොළඹ කොටුවේ පිහිටි ආ. වැ. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කායර්‍යාලයෙහි හෝ කොළඹින් පිටත ඕනෑම කච්චේරියක හෝ තැන්පත් කළ හැකිය.

වී. ඊ. හේරත්,
ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ
වෙනුවට.

1960.10.24,
කොළඹ ආණ්ඩුවේ වැඩ දෙපාර්තමේන්තුවේ
කාර්යාලයේ දීය.

10-832/4

---

# තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම්

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 1960 ජුලි මාසය— ටෙන්ඩර පිළිබඳ අවසාන තීරණ

| | සැපයීම/සේවාවේ නම හා ස්ථානය | ටෙන්ඩර් කරුවන්ගේ ගණන | තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් මිළ ප්‍රමාණය/ගණන |
|---|---|---|---|---|
| 1. | මාරාවිල සතුන් බෝකිරීමේ ස්ථානයේ පොල් 9,000ක් විකිණීම ... | 2 ... | එච්. ඒ. ඩී. වින්සන්ට් අප්පුහාමි ... | 1,000ක් රුපි. 116·50 |
| 2. | බතලගොඩ ගොවිපොලේ පොල් විකිණීම ... ... | 2 ... | ඒ. ධර්මදස ... ... | 1,000 ක් රුපි. 102·25 |
| 3. | ත්‍රිකුණාමලය ගොවිපොලට පොල් අතු සැපයීම ... | 5 ... | කේ. ජී. චාර්ලිස් ද සිල්වා ... | 1,000ක් රුපි. 80 |
| 4. | වාරියපොල ගොවිපොලේ පොල් 18,000ක් විකිණීම ... | 2 ... | ඒ. ධර්මදස ... ... | 1,000ක් රුපි. 107 |
| 5. | මාරාවිල සත්ව ගොවිපොලේ පොල් 9,000ක් විකිණීම ... | 2 ... | එච්. ඒ. ඩී. වින්සන්ට් අප්පුහාමි ... | 1,000ක් රුපි. 116·50 |

10 732/1

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

### 1960 අගෝස්තු මාසය—ටෙන්ඩර පිළිබඳ අවසාන තීරණ

| | සැපයීම/සේවාවේ නම සහ ස්ථානය | ටෙන්ඩර කරුවන්ගේ ගණන | තෝරාගත් ටෙන්ඩර කරුගේ නම | පිළිගත් මිළ ප්‍රමාණය/ගණන |
|---|---|---|---|---|
| 1. | නුවරඑළියේ සීතාඑලිය අර්තාපල් ව්‍යාපාරයට ඇස්බැස්ටස් පිලි සහිත සිමෙන්ති රුපිංසීට් සැපයීම ... | 2 ... | සීමාසහිත වෙට්ටිනාඩ් කෝපරේෂන් ප්‍රයිවේට් සමාගම | රුපි. 98,336 |
| 2. | පේරාදෙණියේ ගන්නොරුවේ වැඩපොලේ සේවයට අයෝග්‍ය ද්‍රව්‍ය විකිණීම | 4 ... | ඈන්. ඇම්. හසීම්-වයර් සඳහා<br>ඩී. සන්තානා මරියම්-බැටරි සඳහා | රුපි. 1,004<br>රුපි. 125 |
| 3. | පේරාදෙණියේ මධ්‍ය පර්යේෂණස්ථානයේ රබර් ගස් 1,200ක් විකිණීම | 6 ... | ඇම්. ඊ. සිරිසේන ... ... | එකක් රුපි. 2.60 |
| 4. | පොළොන්නරු ගොවිපොලේ අක්කර 75ක ගොයම් කපා කොළ ගැසීම | 2 ... | ඇල්. ඒ. සිරිල් ... ... | අක්කරය රුපි. 47 |
| 5. | ත්‍රිකුණාමලයට ගඩොල් 15,000ක් සැපයීම ... ... | 1 ... | ත්‍රිකුණාමල සමුපකාර ගොඩනැගිලි සමිතිය | එකක් ශත 04 |

10-732/2

## 1960.12.31 දක්වා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් සඳහා ගත් අවසාන තීරණ

| සේවය | ලැබුණු ටෙන්ඩර් ගණන | තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ගණන් |
|---|---|---|---|
| 1960.10.1 සිට 1960.12.31 දක්වා මුළුතැන් ගෙට පොල් සැපයීම | 3 | වී. ජේ. එච්. දනපාල මහතා | අංක 1කේ කොප්පරා පාරමක මිළ වශයෙන් රු. 163 ක් සහ දිනපතා පුවත්පත්වල පළවන අංක 1කේ වතු කොප්පරා පාරමක ඉහළම මිළත් අතර ඇති වෙනසින් සියයට 80ක අඩු වීමකට හෝ වැඩිවීමකට යටත්ව, වටප්‍රමාණය අඟල් 12 කට අඩුනැති ගෙඩිය අවුන්ස 26ටත්, 30ටත් අතර බරැති පොල් 1,000ක් රු. 157 බැගින් ගෙනැවිත් භාරදීමට |
| ව්‍රීපොලියට | ... | ඒ. මුණසිංහ මහතා | (i) ගෙඩිය අවුන්ස 30 හෝ වැඩියෙන් බරැති ලෙලි රහිත තෝරපු පොල් 1,000කට දිනපතා පුවත් පත්වල පළවෙන එදිනෙද පවතින අංක 1 කේ වතු කොප්පරා පාරමක ඉහළම මිළට රු. 24.50ක් වැඩියෙන් ගෙනැවිත් භාරදීමට<br>(ii) ගෙඩිය අවුන්ස 26ටත් 30ටත් අතර බරැති ලෙලි රහිත පොල් 1,000කට දිනපතා පුවත් පත්වල පළවෙන එදිනෙද පවතින අංක 1කේ වතු කොප්පරා පාරමක මිළට ගෙනැවිත් බාරදීමට. |
| 1960.10.1 සිට 1961.3.31 දක්වා අළුත් බටර් සැපයීම | 3 | සීමාසහිත ෂිපිං සප්ලයි සමාගම | කොළඹ නගරයේ ආයතනවලට රාත්තල රු. 2.22 බැගින් |
| | | සමුපකාර තොග වෙළෙඳ ආයතනය | ගාල්ල, මාතර, මහනුවර පිහිටි ආයතනවලට රාත්තල රු. 2.40 බැගින් |
| | | ඒ. ඇම්. බුහාරි සහ පුත්‍රයෝ | පිට පළාත්වල පිහිටි ආයතනවලට රාත්තල රු. 2.50 බැගින් |
| 1960.10.1 සිට 1960.12.31 දක්වා හරක් සැපයීම | 3 | ඇම්. ඒ. ඇස්. මොහමඩ් මුස්තාපා මහතා | රු. ශ.<br>1. ඇටකටු ... ... 0 5<br>2. සියයට 25ක් කටු සමඟ ... 0 78<br>3. පස්සාගාත් ... ... 0 80<br>4. කටු සහිතව කපන ලද මස් කැබලි ... 0 73<br>5. වකුගඩු ... ... 1 5<br>6. පිකුදු ... ... 2 50<br>7. මොළය ... ... 0 83<br>8. තට්ටම් සහ තුනටි මස් ... 0 78<br>9. තට්ටම් මස් ... ... 0 78<br>10. තුනටි කැල්ල සමඟ යටින් කපන ලද මස් ... ... 0 78<br>11. එසේම මැදින් කපන ලද මස් ... 0 78<br>12. ඉස්ටු මස් ... ... 0 80<br>13. සුප් මස් ... ... 0 65<br>14. ඇටකටු සහිත කෙණ්ඩා මස් ... 0 55<br>15. ඇටකටු රහිත මස් ... 0 83<br>16. බැදුමට සුදුසු ඝන මස් ... 0 85<br>17. තැම්බීමට සුදුසු ඝන මස් ... 0 85<br>18. වලිගා ... ... 0 60<br>19. දිව ... ... 0 60<br>20. බොකු කිරිබඩවැල් ... 0 15<br>21. හෘදය ... ... 0 95<br>22. ඇටකටු රහිත හරක්මස් ... 0 94<br>23. වහු පටවුන්ගේ මස් ... 0 75<br>24. යටපැත්තේ මස් ... ... 1 10 |
| 1960 සැප්තැම්බර් තුළ අළුත් බිත්තර සැපයීම | 3 | කේ. ජී. ටී. සහ සමාගම | බිත්තර 1,000ක් රුපි. 210 බැගින් |
| **කුළු බඩු සැපයීම—** | | | |
| 1960.7.1 සිට 1960.7.31 දක්වා කාලයට ... | 6 | වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සහ සමාගම | බොම්බේ ලූනු හොණ්ඩරය රු. 20 බැගින්<br>අල හොණ්ඩරය රු. 26 බැගින් |
| | | ඇම්. මුත්තයියා පිල්ලේ මහතා සිවම් ස්ටෝර්ස් සමාගම | මුං ඇට හො. රු. 31.80 බැගින්<br>සුදුළූනු හො. රු. 35 බැගින්<br>ගොරක හො. රු. 56 බැගින් |
| | | ඇල්. පී. ඇස්. ග්‍රයින්ඩිං මිල්ස් සමාගම | සියඹලා හො. රු. 39 බැගින් |
| | | සෙයාදු ආදම් සහ සමාගම | කුරුඳු නො. 2 රු. 242 බැගින් |
| සුරුට්ටු, දුම්කොළ සහ හුණු, සැපයීම 1960.8.1 සිට 1960.10.31 දක්වා කාලයට | 1 | ඇස්. ජේ. රාජු මහතා | සුරුට්ටු 1,000ක් රු. 24 බැගින්, රට දුම්කොළ 1.000ක් රු. 250 බැගින්, සිංහල දුම්කොළ 100ය රු. 17 බැගින්, හුණු රාත්තල් 100 රු. 14 බැගින් |
| **කුළු බඩු සැපයීම—** | | | |
| 1960.8.1 සිට 1960.8.15 දක්වා කාලයට... | 6 | ඇම්. මුත්තයියා පිල්ලේ මහතා | බො. ලූනු හොණ්ඩරය රු. 19.50 බැගින් |
| | | ඇම්. මුත්තයියා පිල්ලේ මහතා | සුදුළූනු හොණ්ඩරය රු. 35 බැගින් |
| | | වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සහ සමාගම | මුං ඇට හොණ්ඩරය රු. 32.75 බැගින්<br>කොත්තමල්ලි හොණ්ඩරය රු. 51.50 බැගින් |
| | | සිවම් ස්ටෝර්ස් සමාගම | ගොරක හොණ්ඩරය රු. 51 බැගින් |
| | | ඇල්. පී. ඇස්. ග්‍රයින්ඩිං මිල්ස් සමාගම | සියඹලා හොණ්ඩරය රු. 39 බැගින් |
| | | සෙයාදු ආදම් සහ සමාගම | කුරුඳු (නො. 1) රු. 248 බැගින් |

| සේවය | ලැබුණු ටෙන්ඩර් ගණන | තෝරාගත් ටෙන්ඩර්කරුගේ නම | පිළිගත් ගණන් |
|---|---|---|---|
| කුළු බඩු සැපයීම— | | | |
| 1960.8.10 සිට 1960.8.31 ... | 5 ... | සිවම් ස්ටෝර්ස් සමාගම ... | සුදුළූනු හොණ්ඩරයක් රු. 51 බැගින් |
| | | සිවම් ස්ටෝර්ස් සමාගම ... | ගොරකා හොණ්ඩරයක් රු. 46 බැගින් |
| | | වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සමාගම | සියඹලා හොණ්ඩරයක් රු. 33 බැගින් |
| | | සෙයාදු ආදම් සහ සමාගම ... | ගම්මිරිස් (කළු) හොණ්ඩරයක් රු. 257 බැගින් |
| කුළු බඩු සැපයීම— | | | |
| 1960.9.1 සිට 1960.9.15 දක්වා කාලයට ... | 4 ... | වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සහ සමාගම | බො. ලූනු හොණ්ඩරයක් රු. 13·25 බැගින් |
| | | | මිරිස් (රත්ගුන්) හොණ්ඩරයක් රු. 122 බැගින්. |
| | | | සුදුලූනු හොණ්ඩරයක් රු. 37 බැගින් |
| | | ජේ. කේ. කේ. නාටරාජා සහ සමාගම | අල (නේපාල) හොණ්ඩරයක් රු. 18 බැගින් |
| | | ඇම්. මුත්තයියා පිල්ලේ මහතා ... | සියඹලා හොණ්ඩරයක් රු. 30 බැගින් |
| | | ඇම්. මුත්තයියා පිල්ලේ මහතා ... | කහ හොණ්ඩරයක් රු. 58.25 බැගින් |
| | | සෙයාදු ආදම් සහ සමාගම ... | ගොරක හොණ්ඩරයක් රු. 46 බැගින් |
| | | සෙයාදු ආදම් සහ සමාගම ... | කුරුඳු (නො. 2) හොණ්ඩරයක් රු. 235 බැගින් |
| | | සෙයාදු ආදම් සහ සමාගම ... | ගම්මිරිස් (කළු) හොණ්ඩරයක් රු. 228 බැගින් |
| කුළු බඩු සැපයීම— | | | |
| 1960.9.18 සිට 1960.9.30 දක්වා කාලයට ... | 4 ... | වී. ටී. වී. දේවනායගම් පිල්ලේ සහ සමාගම | බො. ලූනු හොණ්ඩරයක් රු. 14 බැගින් |
| | | | මිරිස් හොණ්ඩරයක් රු. 123 බැගින් |
| | | එම ... | සුදුළූනු හොණ්ඩරයක් රු. 45 බැගින් |
| | | එම ... | සියඹලා හොණ්ඩරයක් රු. 30 බැගින් |
| | | එම ... | කහ හොණ්ඩරයක් රු. 57 බැගින් |
| | | ඇම් මුත්තයියා පිල්ලේ සහ සමාගම ... | අල හොණ්ඩරයක් රු. 23·45 බැගින් |
| | | සෙයාදු ආදම් සහ සමාගම ... | ගොරක හොණ්ඩරයක් රු. 44 බැගින් |
| අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොළඹ ආයතනවල තිබෙන පාවිච්චි කරන ලද බඩු විකිණීම | 11 ... | පී. ඇස්. පී. ටී. තංගසාමි නාඩාර් සහ සමාගම | බොරැල්ලේ බේකරියේ ඇති පරණ බඩු රු. 4,115 |
| | | ඇම්. මුත්තයියා පිල්ලේ මහතා | නාරාහේන්පිට පළතුරු ටින් කිරීමේ අංශයේ පරණ බඩු රු. 287·51 |
| | | ජේ. ඩබ්ලිව්. විජේසිංහ මහතා ... | මරදානේ පොස්ටර් ලේන් ස්ටෝර්ස්, පරණ බඩු රු. 22·15 |
| වේවැල් කුඩා සැපයීම ... ... | 2 ... | එලුවැල් ගාල් වේවැල් සපයන්නන්ගේ සමුපකාර සමිතිය | පියන් සහිත ලොකු කුඩා 100 රු. 1,380 බැගින් |
| | | | පියන් සහිත කුඩා ඒවා 100 රු. 1,070 බැගින්. |
| ප්‍රවාහන අංශයේ තිබෙන පාවිච්චි කිරීමට නොහැකි මෝටර් වාහනවල බඩු කෑලි | 6 ... | ඩී. සන්තනමරියන් (ටයර් වලට) ... | පරණ ටයර් රු. 434 කට |
| | | ඇම්. පෙරේරා, (ටයර් නැතිව අනිත් සියළුම බඩු කෑලි වලට) | ටයර් නැතිව අනිත් සියළුම බඩු රු. 1,027·86 කට |
| ප්‍රවාහන අංශයේ තිබෙන පාවිච්චි කළ මෝටර් වාහන | 12 ... | ඇල්. ඒ. පෙරේරා මහතා ... | ඞී. ඊ. 4288 දරණ මෝටර් වාහනය රු. 2,051 |
| | | ඇස්. තෝමස් මහතා ... | සී. ඊ. 8346 දරණ වාහනය රු. 459·00 |
| | | එම ... | සී. වයි. 2857 දරණ වාහනය රු. 389·00 |
| | | සීමාසහිත ඩෙූල් (සිලෝන්) සමාගම | සී. ඊ. 8775 දරණ වාහනය රු. 851·25 |
| | | එම ... | සී. ඊ. 8776 දරණ වාහනය රු. 851·25 |
| | | එම ... | සී. වයි. 9759 දරණ වාහනය රු. 1,251·50 |
| | | ඇම්. පරම්ජෝති මහතා ... | සී. ඊ. 8777 දරණ වාහනය රු. 609.00 |
| | | සියම් බු ස්ටෝර්ස් ... | සී. ඇල්. 4260 දරණ වාහනය රු. 777·00 |

1960 ඔක්තෝබර් මස 14 වැනි දින,
62, වැතැම් වීදිය, කොළඹ 1

ඇල්. බී. රාජකරුණා,
අලෙවි කිරීම් කොමසාරිස්තුමා වෙනුවට.

10–602

# තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම

## රත්නපුර දිස්ත්‍රික්කයේ ඉඩන්ගොඩ-අයගම පාරේ කළුගඟ හරහා ඇති ඉඩන්ගොඩ තොටුපලේ රේන්දය විකිණීම

රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත විසින් සියළුම තොටුපල්වල රේන්ද විකිණීමේ පොදු කොන්දේසි මාලාවට යටත්ව 1961 ජනවාරි මස 1 වැනි දින පටන් 1961 දෙසැම්බර් මස 31 වැනි දිනය තෙක් වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් පූර්වෝක්ත රේන්දය විකිණීම සඳහා වූ ටෙන්ඩර පත්‍ර 1960 නොවැම්බර් මස 5 වැනි දින පෙරවරු 11 ට රත්නපුර කච්චේරියේදී බාර ගනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එදිනම පෙරවරු 11.30 ට ටෙන්ඩර පත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩර පත්‍ර විවෘත කරනු ලබන වේලාවේදී ටෙන්ඩරකරුවන්ටද එහි සිටීමට ඉඩ දෙනු ලැබේ.

2. පයින් ගමන් කරන මගීන් මෙන්ම බර වාහනාදියද ගෙන යාමට ලීයෙන් සෑදූ පාලම් පාරුවක් පිළිගත් ටැන්ඩරකරුට සපයනු ලැබේ. රේන්දය බල පැවැත්වෙන කාලය තුළදී මේ පාලම් පාරුව හොඳින් අළුත්වැඩියා කොට තබා ගැනීම් ගැන බදුකරු වග කිව යුතුය.

3. සියළුම ටෙන්ඩර පත්‍ර ලියුම් කොපුවල බහා සීල්තබා එවිය යුතුය. ලියුම් කොපු මුදුනේ වම් කෙළවරෙහි "ඉඩන්ගොඩ තොටුපළ රේන්දය පිළිබඳ ටෙන්ඩරය" යන්න ලියා තිබිය යුතුය. ටෙන්ඩර පත්‍ර නියමිත වේලාවේදී හෝ ඊට කලින් හෝ කච්චේරියේ ටෙන්ඩර පෙට්ටියට දැමිය හැකිය.

4. එක් එක් ටෙන්ඩර පත්‍රය වෙනුවෙන් රුපියල් 50 ක මුදලක් තැන්පත් කළ යුතුය. මේ මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ පිළිබඳ කුවිතාන්සිය ටෙන්ඩර පත්‍රයට ඇමිණිය යුතුය. යම් කිසි ටෙන්ඩරකරුවකු නියමිත ඇපය බැඳීම ප්‍රතික්ෂේප කළහොත් හෝ යම් කිසි ටෙන්ඩරකරුවකුට නියමිත ඇපය තැබීමට නොහැකි වුව හොත් හෝ ටැන්ඩර පත්‍රය සඳහා ඔහු තැන්පත් කළ මුදල රාජ සන්තක කරනු ලැබේ. එසේම එවැනි කෙනෙකුට මතුවට ආණ්ඩුවේ කොන්ත්‍රාත්තු ගැනීමට ද ඉඩ දෙනු නොලැබේ. තෝරාගත් ටෙන්ඩර කරු විසින් විකිණීම පිළිබඳ කොන්දේසි මාලාව අත්සන් කරනු ලැබුවාට පසු අනික් ටැන්ඩර් පත්‍ර සඳහා තැන්පත් කරන ලද සියළුම මුදල් ඒ ඒ අයට ආපසු දෙනු ලැබේ.

5. කාල පරිච්ඡේදය සඳහාවූ ගැනුම් මිලෙන් දහයෙන් පංගුවක් වහාම මුදලෙන් තැන්පත් කරන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට නියම කරනු ලැබේ. ටෙන්ඩරය ආණ්ඩුව විසින් බාරගනු ලැබුවොත්

එකී වැඩිම ටෙන්ඩරකරු වශයෙන් තමා රේන්දය ඉල්ලුම් කළේ යම් මුදලකටද, ඒ මුදල් ගණන නිති පතා ගෙවන බවට හා තමා ගිවිසුමේ සියළුම වගන්ති විධිවූ පරිදි ඉෂ්ට කරන බවට පොරොන්දු වීමේ කොන්දේසි ඇතුළත් බැඳුම්කරයකට ඔහු විසින් අත්සන් කළ යුතුය. එසේම එකී බැඳුම්කරයට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක් වෙතොත් ඒ නඩුව පිළිබඳව විනිශ්චයට එකඟ වන බවට සවකීය ඇටෝර්නි බලයද නීතියෙන් අනුදත් ආකෘතියේ ප්‍රකාරයට ලියා අත්සන් කරදිය යුතුය. තමාගේ ටෙන්ඩරය බාර ගන්නා ලද බව තමාට දැනුම් දෙනු ලැබූ දිනයේ සිට සති දෙකක් ඇතුළත දී අනුමත කරනු ලබන දේපල ඇපයකින් නම් දොළොස් මාසය වෙනුවෙන් වූ ගැනුම් මිලෙන් හරි අඩක හෝ මුදලින් නම් එකී මිලෙන් තුනෙන් පංගුවක හෝ ඇපයක්ද ඔහු විසින් තැබිය යුතුය.

6. ඇප වශයෙන් ඉදිරිපත් කරනු ලබන අයිතිය පිළිබඳ ඔප්පු හෝ දේපළ හෝ පරීක්‍ෂා කොට ඒ පිළිබඳ සවකීය අදහස ප්‍රකාශ කිරීමත් ඇප බැඳුම්කරය පරීක්‍ෂා කොට බේරුමක් කිරීමත් සඳහා ආණ්ඩුවේ නීතිඥයන් අයකරන ගාස්තුවද ලිපි ලේඛන පරීක්‍ෂා කොට ඇප බැඳුම්කරය කෙටුම්පත් කිරීම සඳහා ආණ්ඩුවේ නීතිඥයන් අය කරන ගාස්තුව ද, දේපල තක්සේරු කිරීම හා ඇප බැඳුම්කරය ලියා පදිංචි කිරීමට යන වියදමද 189 වැනි පරිච්ඡේදය වන මුද්දර ආඥාපණත යටතේ බැඳුම්කරවල මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවිය යුතු වන්නේ ය.

7. ඇප වශයෙන් ඉදිරිපත් කෙරෙන අයිතිය පිළිබඳ වූ සියළුම ඔප්පු සමග ඒ ඒ ඔප්පු අදාල වන ඉඩම් බැඳීම් ආදී අවහිර කම් වලින් තොර බවට ඉඩම් රෙජිස්ට්‍රාර් ගෙන් ලබාගත් සහතිකයක්ද එවිය යුතුය. මේ සහතිකය ලබාගත යුත්තේ ඇපය ඉදිරිපත් කරන පක්‍ෂයේ වියදමිනි.

8. තමාගේ හෝ තම සේවකයන්ගේ හෝ නොසැලකිල්ල නිසා පාලම් පාරුවට යම් යම් විශේෂ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය වුවහොත් ඊට යන වියදම තෝරා ගත් ටෙන්ටර්කරු විසින් ගෙවිය යුතුය. එවැනි සියළුම අළුත්වැඩියා කිරීම් සඳහා යන වියදම ගෙවන බවට ඇපයක් වශයෙන් ආණ්ඩුවේ ඒජන්ත නියම කරන මේ මුදලක් ද රේන්දය විකුණනු ලබන දිනයේදීම ඔහු විසින් ගෙවිය යුතුය.

ආර්. බී. අබයරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති.

1960 ඔක්තෝබර් මස 18 වන දින,
රත්නපුර දිසාපති කාර්යාලයේදී ය.

10-714

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ නිරුවානාකැටිය—අගලවත්ත පාරේ 25 වැනි සැතැප්ම තුළ කුකුළුගඟ හරහා ඇති කුකුලේගම රේන්ද තොටුපළේ රේන්දය විකිණීම

රත්නපුර පාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත විසින් සියළුම තොටුපල්වල රේන්ද විකිණීමේ පොදු කොන්දේසි මාලාවට යටත්ව 1961 ජනවාරි මස 1 වැනි දින පටන් 1961 දෙසැම්බර් මස 31 වැනි දිනය තෙක්වූ කාල පරිච්ඡේදය වෙනුවෙන් පූර්වෝක්ත රේන්දය විකිණීම සඳහා වූ ටෙන්ඩරපත්‍ර 1960 නොවැම්බර් මස 5 වැනි දින පෙරවරු 10 ට රත්නපුර කච්චේරියේදී බාර ගනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එදිනම පෙරවරු 10.30 ට ටෙන්ඩරපත්‍ර විවෘත කරනු ලැබේ. ටෙන්ඩරපත්‍ර විවෘත කරනු ලබන වේලාවේදී ටෙන්ඩර් කරුවන්ටද එහි සිටීමට ඉඩ දෙනු ලැබේ.

2. පයින් ගමන් කරන මඟින් මෙන්ම බර වාහනාදියද ගෙන යාමට ලීයෙන් සෑදූ පාලම් පාරුවක් පිළිගත් ටැන්ඩරකරුට සපයනු ලැබේ. රේන්දය බල පැවැත්වෙන කාලය තුළදී මේ පාලම්පාරුව හොඳින් අළුත්වැඩියා කොට තබා ගැනීම ගැන බඳුකරු වග කිව යුතුය.

3. සියළුම ටෙන්ඩර පත්‍ර ලියුම් කොපුවල බහා සීල් තබා එවිය යුතුය. ලියුම් කොපු මුදුනේ වම් කෙළවරෙහි "කුකුලේගම තොටුපළ රේන්දය පිළිබඳ ටෙන්ඩරය" යන්න ලියා තිබිය යුතුය. ටෙන්ඩර පත්‍ර නියමිත වේලාවේදී හෝ ඊට කලින් හෝ කච්චේරියේ ටෙන්ඩර පෙට්ටියට දැමිය හැකිය.

4. එක් එක් ටෙන්ඩර පත්‍රය වෙනුවෙන් රුපියල් 50 ක මුදලක් තැන්පත් කළ යුතුය. මේ මුදල ඕනෑම කච්චේරියක තැන්පත් කොට ඒ පිළිබඳ කුවිතාන්සිය ටෙන්ඩර පත්‍රයට ඇමිණිය යුතුය. යම් කිසි ටෙන්ඩර කරුවකු නියමිත ඇපය බැඳීම ප්‍රතික්ෂේප කළ හොත් හෝ යම් කිසි ටෙන්ඩරකරුවකුට නියමිත ඇපය බැඳීමට නොහැකි වුව හොත් හෝ ටැන්ඩර පත්‍රය සඳහා ඔහු තැන්පත් කළ මුදල රාජ සන්තක කරනු ලැබේ. එසේම එවැනි කෙනෙකුට මතුවට ආණ්ඩුවේ කොන්ත්‍රාත් ගැනීමට ද ඉඩ දෙනු නොලැබේ. තෝරා ගත් ටැන්ඩර කරු විසින් විකිණීම පිළිබඳ කොන්දේසි මාලාව අත්සන් කරනු ලැබූ වාට පසු අනික් ටැන්ඩර පත්‍ර සඳහා තැන්පත් කරන ලද සියළුම මුදල් ඒ ඒ අයට ආපසු දෙනු ලැබේ.

5. කාල පරිච්ඡේදය සඳහා වූ ගැනුම් මිලෙන් දහයෙන් පංගුවක් වහාම මුදලෙන් තැන්පත් කරන ලෙස තෝරාගත් ටෙන්ඩර්කරුට නියම කරනු ලැබේ. ටෙන්ඩරය ආණ්ඩුව විසින්ම බාරගනු ලැබුවොත් එකී වැඩිම ටෙන්ඩරකරු වශයෙන් තමා රේන්දය ඉල්ලුම් කළේ යම් මුදලකටද, ඒ මුදල් ගණන නිති පතා ගෙවන බවට හා තමා ගිවිසුමේ සියළුම වගන්ති විධිවූ පරිදි ඉෂ්ට කරන බවට පොරොන්දු වීමේ කොන්දේසි ඇතුළත් බැඳුම්කරයකට ඔහු විසින් අත්සන් කළ යුතුය. එසේම එකී බැඳුම්කරයට විරුද්ධව පවරනු ලබන යම් නඩුවක් වෙතොත් ඒ නඩුව පිළිබඳව විනිශ්චයට එකඟ වන බවට සවකීය ඇටෝර්නි බලයද නීතියෙන් අනුදත් ආකෘතියේ ප්‍රකාරයට ලියා අත්සන් කර දිය යුතුය. තමාගේ ටෙන්ඩරය බාර ගන්නා ලද බව තමාට දැනුම් දෙනු ලැබූ දිනයේ සිට සති දෙකක් ඇතුළත දී අනුමත කරනු ලබන දේපල ඇපයකින් නම් දොළොස් මාසය වෙනුවෙන් වූ ගැනුම් මිලෙන් හරි අඩක හෝ මුදලින් නම් එකී මිලෙන් තුනෙන් පංගුවක හෝ ඇපයක් ද ඔහු විසින් තැබිය යුතුය.

6. ඇප වශයෙන් ඉදිරිපත් කරනු ලබන අයිතිය පිළිබඳ ඔප්පු හෝ දේපල හෝ පරීක්ෂා කොට ඒ පිළිබඳ සවකීය අදහස ප්‍රකාශ කිරීමත් ඇප බැඳුම්කරය පරීක්ෂා කොට බේරුමක් කිරීමත් සඳහා ආණ්ඩුවේ නීතිඥයන් අයකරන ගාස්තුවද ලිපි ලේඛන පරීක්‍ෂා කොට ඇප බැඳුම්කරය කෙටුම්පත් කිරීම සඳහා ආණ්ඩුවේ නීතිඥයන් අය කරන ගාස්තුව ද, දේපල තක්සේරු කිරීම හා ඇප බැඳුම්කරය ලියා පදිංචි කිරීමට යන වියදමද 189 වැනි පරිච්ඡේදය වන මුද්දර ආඥා පණත යටතේ බැඳුම්කරවල මුද්දර ගාස්තුවද ඔහු විසින් ගෙවිය යුතු වන්නේ ය.

7. ඇප වශයෙන් ඉදිරිපත් කෙරෙන අයිතිය පිළිබඳ වූ සියළුම ඔප්පු සමග ඒ ඒ ඔප්පු අදාල වන ඉඩම් බැඳීම් ආදී අවහිර කම් වලින් තොර බවට ඉඩම් රෙජිස්ට්‍රාර් ගෙන් ලබාගත් සහතිකයක්ද එවිය යුතුය මේ සහතිකය ලබාගත යුත්තේ ඇපය ඉදිරිපත් කරන පක්ෂයේ වියදමිනි.

8. තමාගේ හෝ තම සේවකයන්ගේ හෝ නොසැලකිල්ල නිසා පාලම් පාරුවට යම් යම් විශේෂ අළුත්වැඩියා කිරීමට අවශ්‍ය වුවහොත් ඊට යන වියදම තෝරා ගත් ටෙන්ඩරකරු විසින් ගෙවිය යුතුය. එවැනි සියළුම අළුත්වැඩියා කිරීම සඳහා යන වියදම ගෙවන බවට ඇපයක් වශයෙන් ආණ්ඩුවේ ඒජන්ත නියම කරන යම් මුදලක් ද රේන්දය විකුණනු ලබන දිනයේදීම ඔහු විසින් ගෙවිය යුතුය.

ආර්. බී. අබයරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති.

1960 ඔක්තෝබර් මස 18 වනදින,
රත්නපුර දිසාපති කාර්යාලයේදීය.

10-718

---

ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.